# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,932 — 1970 නොවැම්බර් 12 වැනි බ්‍රහස්පතින්ද — 1970.11.12

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... ... | 807 | ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... | — |
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 809 | අය-වැය ශේෂ්ඨක ... ... ... | 811 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — | ශෛද්පල පිරිකීම ... ... ... | — |
| අකුරු ව්‍යවස්ථා ... ... ... | — | මාර්ග කොමිටි දැන්වීම ... ... ... | — |
| පළාත් පාලන සභා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — | විවිධ දැන්වීම ... ... ... ... | 814 |


## පළාත් පාලන නිවේදන

### විදුලි බල පනත

වාරිමාර්ග, විදුලි බලය හා මහාමාර්ග ඇමතිතුමාගෙන් විෂය රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිතුමා විසින් දෙන ලද අනුමැතිය ඇතිව දන්කොටුව සුළු නගර සභාව විසින් 1957 අංක 59 දරන පනතින් සංශෝධිත (205 වන අධිකාරය වන) විදුලි බල ආඥාපනතේ 46 වැනි වගන්තිය යටතේ සම්පාදිත වූ නියෝග.

බී. එච්. ද සොයිසා,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු
අමාත්‍යාංශයේ වැඩ බලන අතිරේක ස්ථිර ලේකම්.

70.11.3. දින,
කොළඹ දී ය.

### නියෝග

1. මේ නියෝගවල—

"පනත" යනුවෙන් 1957 අංක 59 දරන පනතින් සංශෝධිත (205 වැනි අධිකාරය වන) විදුලි බල පනත අදහස් කරනු ලැබේ.

"බලපත්‍රය" යනුවෙන් පනතේ 2 වෙනි වගන්තිය යටතේ දන්කොටුව සුළු නගර සභාවේ සභාපති වෙත නිකුත් කරන ලද බලපත්‍රය අදහස් කරනු ලැබේ.

"බලපත්‍රලාභියා" යනුවෙන් දන්කොටුව සුළු නගර සභාවේ සභාපති අදහස් කරනු ලැබේ.

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දැක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම දෙකොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1970 ජූනි මස 2 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

ආර්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

---

2. තම ප්‍රයෝජනය පිණිස බලපත්‍රලාභියාගෙන් විදුලි බලය ලබා ගැනීමට බලාපොරොත්තු වන යම් කෙනෙකු විසින්—

(අ) විදුලි බලය ලබාගැනීමට ඕනෑ කරන දින සිට යටත් පිරිසෙයින් දවස් දහහතරකට මත්තෙන් ඒ සඳහා බලපත්‍රලාභියා විසින් සපයනු ලබන ආකෘති පත්‍රයෙහි පිළියෙල කළ ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළ යුතුය ; තවද

(ආ) විද්‍යුත් වේගවාහක කේබල් කම්බිය සඳහා ගාස්තු බලධාරියා වෙත කලින් ගෙවීම, හෝ බලපත්‍රලාභියා එසේ නියම කරන්නේ නම් ආඥපනතේ 33 වෙනි වගන්තිය යටතේ බලපත්‍රලාභියා සමග ලිඛිත ගිවිසුමකට ඇතුළත් විම කළ යුතුය.

3. (අ) බලපත්‍රලාභියාගේ විද්‍යුත් වේගවාහක ප්‍රධාන කම්බියට සම්බන්ධ කිරීමට අදහස් කෙරෙන විදුලි බල සංස්ථාපනයක කම්බි ඇදීම පාරිභෝගිකයා විසින් කම්බි ඇදීම පිළිබඳව ඉංජිනේරු ආයතනය විසින් නියම කරනු ලැබූ නියෝග වලට අනුව කටයුතු කළ හැකි සමාගමකට හෝ පුද්ගල යෙකුට පැවරිය යුතුය. බලපත්‍රලාභියා විසින් බලය පවරනු ලැබූ නිලධරයෙකු විසින් ඒ කර්මාන්තය පරීක්ෂා කොට අත්හදා බැලීමෙන් හා කම්බි ඇදීම පිළිබඳ ඉහත කී නියෝග අනුව ඒ කර්මාන්තය නිම කර ඇත්තේ යයි බලපත්‍රලාභියා සෑහීමට පත් වූවාට පසු පමණක් එබඳු සංස්ථාපනයකට විදුලි බලය සැපයිය හැකිය.

(ආ) සංස්ථාපනය එකී නියෝගවලට අනුකූල නොවන්නේ නම්, ඒ සංස්ථාපනය ඒ නියෝගවලට අනුකූලව සකස් කරනු ලබනතුරු ඒ ස්ථානයට විදුලි බලය නොදිය යුතුය.

4. විදුලි බලය පාවිච්චි කරන සෑම පාරිභෝගිකයෙකු විසින් ම බලපත්‍රයේ සඳහන් කරන ලද ප්‍රමාණ අනුව ඒ විදුලි බලය සඳහා මුදල් ගෙවිය යුතුය.

5. (අ) පාරිභෝගිකයාට අයත් භූමියෙහි පිහිටුවා තිබෙන විද්‍යුත් වේගවාහක කම්බියේ කොටස, විදුලි බල පරිවර්තක, ප්‍රධාන ගිනි නූල්, විද්‍යුත් මාපකය සහ විදුලි යතුරු පුවරු ද බලපත්‍රධාරියා සතු දේපළ වශයෙන් පැවතිය යුතු අතර, බලපත්‍රලාභියාගේ බලය පවරනු ලැබූ සේවකයෙකු විසින් හැර වෙන යම් කෙනෙකු විසින් මොනම කාරණයක් සඳහා වත් ඒවා වෙනස් කිරීම හෝ අතපත ගෑම හෝ නොකළ යුතුය.

(ආ) බලපත්‍රලාභියාගේ ප්‍රධාන ගිනි නූලේ හෝ මීටරයේ සිට ස්වකීය පාර්ශ්වයේ ඇත්තාවූ කම්බි, කේබල් කම්බි හා උපකරණ නඩත්තු කිරීම ගැන පාරිභෝගිකයා විසින් වග කිව යුතුය.

(ඇ) ආඥපනතේ 47 (3) වැනි වගන්තිය යටතේ අසම්බන්ධ කරන ලද විදුලි බල සංස්ථාපනයක් නැවත සම්බන්ධ කිරීමේදී එය සෝදිසි කර බැලීම හා නැවත සම්බන්ධ කිරීම සඳහා බලපත්‍රයෙහි විධි විධාන සලසා ඇති පරිදි උචිත ගාස්තුවක් අය කළ යුතු අතර පාරිභෝගිකයා විසින් කලින් ගෙවිය යුතුය.

(ඈ) යම් පාරිභෝගිකයකුගේ විදුලි කම්බිවල හෝ උපකරණවල යම් කොටසකින් විදුලි බලය කාන්දු වීමක් සිදු වුවහොත් ස්වකීය ස්ථානයේ පාවිච්චි වූ ලෙස මාපකයේ සටහන් වූ සියළුම විදුලි බලය සඳහා පාරිභෝගිකයා විසින් විදුලි බල පනතේ 41 වන වගන්තියට අනුව මුදල් ගෙවීමට බැඳී සිටිය යුතුය.

6. (අ) තමාට විදුලි බලය සැපයුවාට පසු යම් විටෙක තාවකාලිකව හෝ ස්ථිර වශයෙන් යම් ලාම්පුවක් හෝ පංකාවක් හෝ දැනට පාවිච්චි කරන මෝටරයට වඩා විශාල වූ මෝටරයක් පාවිච්චි කිරීමට හෝ වැඩිපුර යම් ලාම්පුවක් හෝ විදුලි බලය පාවිච්චි වන වෙනයම් උපකරණයක් සවි කිරීමට හෝ තමාගේ දේපොලෙහි ඇද තිබෙන විදුලි කම්බි කොයි අන්දමකින් නමුත් වෙනස් කිරීමට හෝ දික් කිරීමට හෝ අදහස් කරන සෑම පාරිභෝගිකයකු විසින්ම, එබඳු දික්කිරීමක් හෝ වෙනස් කිරීමක් පිළිබඳ කටයුතු ආරම්භ කිරීමට යටත් පිරිසෙයින් දින දෙකකටවත් මත්තෙන් එබඳු යම් වෙනස් කිරීමක් හෝ දික් කිරීමක් පිළිබඳව බලපත්‍රලාභියා වෙත දැනුම් දිය යුතුය.

(ආ) කිසිම පාරිභෝගිකයකු විසින් තාවකාලිකව හෝ ස්ථිර වශයෙන්, යම් දීර්ඝ කිරීමක්, ලාම්පුවක් හෝ පංකාවක් හෝ දැනට පාවිච්චි කරන මෝටරයකට වඩා විශාල වූ මෝටරයක් පාවිච්චි කිරීම හෝ වැඩිපුර යම්කිසි ලාම්පුවක් හෝ විදුලිබලයෙන් ක්‍රියා කරන උපකරණයක් විද්‍යුත් වේගවාහක ප්‍රධාන කම්බියට සවිකිරීම, ඒ දීර්ඝ කිරීම, ලාම්පුව, පංකාව, මෝටරය, වැඩිපුර ලාම්පු හෝ වෙනත් උපකරණ බලපත්‍රධාරියා විසින් ඒ සඳහා බලය පවරන ලද නිලධරයෙකු විසින් පරීක්ෂාකොට අත්හදාබලා සතුටු දායක යයි ඒත්තු ගතහොත් මිස, සවි නොකළ යුතුය.

7. (අ) යම් ස්ථානයක බලපත්‍රලාභියාගේ ගිනි නූල උණුවී ගියහොත්, පාරිභෝගිකයා විසින් අවස්ථාවොචිත පරිදි, බලපත්‍රලාභියාගේ විදුලි බලස්ථානය හෝ උප බලස්ථානය භාර නිලධාරියා වෙත ඒ බව වහාම දැනුම් දිය යුතුය.

(ආ) බලධාරියා විසින් බලය දෙන ලද නිලධරයෙකුගෙන් හෝ බලපත්‍රලාභියා විසින් සේවයෙහි යොදවා සිටින කම්කරුවෙකු නොවන කිසිම තැනැත්තෙකු විසින් බලපත්‍රලාභියාගේ දේපල වන උණුවී ගිය ගිනි නූල වෙනුවට වෙනින් ගිනි නූලක් දැම්ම නොකළ යුතුය.

(ඉ) පාරිභෝගිකයාගේ හෝ බලපත්‍රලාභියාගේ හෝ දේපල වන යම් ගිනි නූලක් වෙනුවට වෙනකක් දැමීමට බලපත්‍රලාභියා ගේ යම් නිලධාරියකුගේ හෝ කම්කරුවෙකුගේ හෝ සේවය වුවමනා කරන්නේ නම් ඒ සඳහා ගෙවිය යුතු බලපත්‍රයේ සඳහන් උචිත ගාස්තුව පාරිභෝගිකයාගේ ඒ මාසයේ ගණනට ඇතුළත් කළ යුතුය.

8. විදුලි බලය සැපයීමේදී සම්පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් හෝ සිදුවන බාධා හේතුකොටගෙන නියම වශයෙන් හෝ අනියම් වශයෙන් හෝ සිදුවන පාඩුවක් හෝ අලාභ හානියක් සම්බන්ධයෙන් බලපත්‍රලාභියා පාරිභෝගිකයාට වග කීමට බැඳී නොසිටී.

9. ආඥපනතේ 45 වැනි වගන්තිය යටතේ අසම්බන්ධ කොට තිබුණා වූ විදුලි බල සංස්ථාපනය නැවත සම්බන්ධ කරන කල්හි එය අත්හදා බැලීම හා නැවත සම්බන්ධ කිරීම සඳහා බලපත්‍රයේ සඳහන් ගාස්තුවක් අය කළ යුතුවාත් හැර, එය පාරිභෝගිකයා විසින් කලින් ගෙවිය යුතුය.

10. (අ) සියළුම අයකිරීම්, ගණනක් ඉදිරිපත් කරනු ලැබූ දිනයට අය විය යුතුව තිබෙන්නා සේ සැලකිය යුතුය.

(ආ) යම් ගණනක් පාරිභෝගිකයා වෙත ඉදිරිපත් කොට සතියක් ඇතුළත දී කරන ලද්දේ නම් මිස ගණනක හරි වැරදි පිළිබඳ වූ කිසිම පැමිණිල්ලක් බලපත්‍රලාභියා විසින් භාර නොගත යුතුය.

11. (අ) ස්වකීය ස්ථානයට විදුලි බලය අනවශ්‍ය සෑම පාරිභෝගිකයකු විසින්ම ඒ බව තුන් දවසකට කලින් බලපත්‍රලාභියා වෙත ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

(ආ) (අ) ඡේදයේ සඳහන් දැනුම් දීම කර නොමැති කල්හී, විදුලි බලය අනවශ්‍ය බව දන්වමින් බලපත්‍රලාභියා දැන්වීම ලබන දින සිට දවස් තුනක් ගත වන තුරු ඒ ස්ථානයේ බලපත්‍රලාභියාගේ උපකරණ සම්බන්ධයෙන් පාරිභෝගිකයා වගකිව යුතු අතර, ඒ ස්ථානයේ පාවිච්චි කරන්නට යෙදුන සියළුම විදුලි බලය සම්බන්ධයෙන් ගාස්තු ගෙවීමටද පාරිභෝගිකයා යටත් විය යුතුය. එසේ වුවද එකී දවස් තුන අවසාන වන්නට මත්තෙන් බලපත්‍රලාභියා විසින් සේවය අසම්බන්ධ කරන ලද්දේ නම්, සේවය අසම්බන්ධ කරනු ලබන තාක් ඒ ස්ථානයේ පාවිච්චි වන විදුලි බලය සම්බන්ධයෙන් පමණක් ගාස්තු ගෙවීමට පාරිභෝගිකයා යටත් විය යුතුය.

12. යෝජිත කර්මාන්ත බලපත්‍රලාභියාගේ නිලධරයෙකු විසින් පරීක්ෂා කර බැලීමට හැකි වන පරිදි ඒ පිළිබඳ දවස් දෙකකට නොඅඩු දින ගණනකට කලින් දැනුම් දීමෙන් පසුව මිස, දැනට පවත්නා විදුලි බල සංස්ථාපනයක එක් කිරීම, වෙනස් කිරීම් හෝ සකස් කිරීම් ඇතුළුව විදුලි බල සංස්ථාපන කර්මාන්ත වැනි කිසිදු විදුලි කර්මාන්තයක් ආරම්භ නොකළ යුතුය.

13. බලපත්‍රලාභියා වෙත දැන්වීමක් නොකරනු ලැබ හා ඔහුගේ අනුමැතිය කලින් ලබා නොගෙන යම් ස්ථානයක අළුත් විදුලි බල සංස්ථාපනයක් සම්බන්ධයෙන් වූ යම් විදුලි කර්මාන්තයක් කර ගෙන යන්නේ නම්, බලපත්‍රලාභියා වෙත විධිමත් දැනුම් දීමක් ලැබෙන තුරු හා අවශ්‍ය අත්හදා බැලීම් කරන තුරු බලපත්‍රලාභියා විසින් එකී විදුලි කර්මාන්තය කරගෙන යනු ලබන ස්ථානයට විදුලි බලය සැපයීම ප්‍රතික්ෂෙප කරත හැකිය.

14. බලපත්‍රලාභියාට කලින් දැන්වීමක් නොකර හා ඔහුගේ අවසරය ලබා නොගෙන බලපත්‍රලාභියා විද්‍යුත් වේගවාහක ප්‍රධාන කම්බියට සවිකර ඇත්තාවූ විදුලි බල සංස්ථාපනයක යම් දීර්ඝ කිරීමක් කර ගෙන යනු ලබන විට සම්පූර්ණ විදුලි බල සංස්ථාපනයම සවි කිරීම බලපත්‍රලාභියා විද්‍යුත් වේගවාහක ප්‍රධාන කම්බියෙන් අසම්බන්ධ කරනු ලැබීමට යටත් වීය යුතුය.

15. යම් විදුලි බල සංස්ථාපනයක් නැවත සම්බන්ධ කිරීම සඳහා වූ සෑම ඉල්ලුම් පත්‍රයක්ම බලපත්‍රලාභියා විසින් ඒ සඳහා සපයනු ලැබිය හැකි ආකෘති පත්‍රයක ඉදිරිපත් කළ යුතු අතර විදුලි බලය අවශ්‍ය වන්නට පැය හතලිස් අටකට නොඅඩු කාලයකට ප්‍රථම එය බලපත්‍රලාභියාගේ කාර්යාලය වෙත භාර දිය යුතුය.

11-436—70.11.12 දින අංක 14.932 දරණ ගැසට් පත්‍රය.

# තනතුරු — ඇබෑර්තු

## ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි IV වැනි කොටසෙහි පළ කෙරෙන පළාත් පාලන සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදල වන පොදු කොන්දේසි

1. **දීමනා.**—රජයේ නිලධාරීන්ට අදළ වන ප්‍රමාණයන් හා කොන්දේසි අනුව විවාහක දීමනාවක් ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී 1969 අංක 18 දරණ පළාත් පාලන සේවා පනතට හා පළාත් පාලන සේවා රෙගුලාසිවලටත්, කොමිෂන් සභාව විසින් කලින් කලට නියම කරනු ලබන අනිකුත් සේවා කොන්දේසිවලටත් යටත් වෙයි.

3. **සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(අ) 1952 අගෝස්තු මස 8 වැනි දිනය හා 10,432 වැනි අංකය දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසෙහි පළ කරන ලද උපලේඛනයෙහි සඳහන් තනතුරුද, කලින් කල ඒ උපලේඛනයට එකතු කරන අනික් තනතුරුද, විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය යටතට මාරුකරනු නොලැබූ ස්ත්‍රීන් නොවන පළාත් පාලන සේවා සමාජිකයින් විසින් උසුලනු ලබද්දී, 1962 පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් ක්‍රම රෙගුලාසි යටතේ, විශ්‍රාම වැටුප් සහිත තනතුරු වන්නේය.

(ආ) ආණ්ඩුව යටතේ සේවය කරන නිලධාරීන් ආණ්ඩුවේ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවල 21 වැනි වගන්තිය යටතේ සේවයෙන් මුදා හරිනු ලැබ පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මාරුකර හරිනු ලැබුවහොත්, ඔවුන්ගේ විශ්‍රාම වැටුප් අයිතිවාසිකම් ආරක්ෂා වේ.

(ඇ) ප්‍රාදේශීය බලමණ්ඩලවල විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථාවේ නියෝග හෝ යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරණ සේවකයන් සම්බන්ධයෙන් වූ විට, ඔවුන් අවසානයේදී සේවයෙන් විශ්‍රාම ගැනීමේදී ඔවුන්ට විශ්‍රාම වැටුප් ගෙවීම තීරණය කරනු ලබන්නේ, 1969 අංක 18 දරණ පළාත් පාලන සේවා පනත ප්‍රකාර, පළාත් පාලන සේවයට මාරුකරනු ලැබූ දිනයට ඉස්සරින්ද ඔවුන් සේවයේ යෙදී සිටි ප්‍රාදේශීය බලමණ්ඩලයෙහි විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා හා නියෝග අනුවය.

(ඈ) පළාත් පාලන විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම රෙගුලාසි යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු බවට ප්‍රකාශ කරනු නොලැබූ තනතුරුවලට කෙරෙන පත්වීම් සම්බන්ධයෙන් වූ විට, එම තනතුරුවලට පත්කරනු ලබන අය 1969 අංක 18 දරණ පළාත් පාලන සේවා පනතෙහි 18 වන වගන්තිය යටතේ පිහිටවනු ලැබූ පළාත් පාලන සේවා අර්ථසාධක අරමුදලට, ස්වකීය වැටුපෙන් සියයට පහක් (5%) දයක මුදල් වශයෙන් ගෙවිය යුත්තාහ. අදළ නිලධාරීන්ගේ වැටුපෙන් සියයට හත හමාරක් (7½%) ඔවුන් පත්කරනු ලබන ප්‍රාදේශීය බලමණ්ඩලය විසින් ඔවුන් වෙනුවෙන් ගෙවනු ලැබේ.

(ඉ) ස්ත්‍රීන්ද, වයස 55 ට වැඩි නිලධාරීන්ද පළාත් පාලන සේවයට පත්කරන ලද දිනයට ඉස්සරින්ද ආණ්ඩුව යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරූ නිලධාරීන්ද හැර විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කෙරෙන සියලු දෙනාටම, 1952 ජූනි 30 වැනි දිනය හා 10,329 වැනි අංකය දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් රෙගුලාසි යටතේ පිහිටුවන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට ස්වකීය අනුමාන මූලික වැටුපෙන් සියයට හතරක (4%) මුදලක් ගෙවීමට නියම කරනු ලැබේ. ප්‍රාදේශීය බලමණ්ඩලය විසින් ඒ ඒ නිලධාරියාගේ අනුමාන මූලික වැටුපෙන් සියයට තුනක (3%) දයක මුදලක් ගෙවනු ලැබේ.

(ඊ) ප්‍රාදේශීය බලමණ්ඩලය විසින් නියම කරනු ලබන මුදලක්, මුලින්ම හෝ පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ඇපකාර සමාගමක් මගින් ඉදිරිපත් කරන විශ්වාස සහතික ඇප ඔප්පුවක් මගින් හෝ ඇප තබන ලෙස මේ තනතුරුවලට පත්වන්නන්ට නියම කළ හැකිය.

(උ) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දනටම පළාත් පාලන සේවයට අයත් උපලේඛනගත තනතුරු නොදරන්නන්ට දිවයිනේ කවර පෙදෙසක වුවද සේවය කිරීම සඳහා ශාරීරික වශයෙන් ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස සුදුසුකම් ලත් වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

(ඌ) අන්‍යාකාරයකින් නියමකොට නැති කල්හි සාමාන්‍යයෙන් පත්වීම අවුරුදු තුනක ආධුනික කාලයකට හෝ අවුරුදු තුනකින් පසු ස්ථිර කරනු ලැබීමට හෝ යටත් වෙයි.

(එ) අයදුම්කරුවන්, නියම කරනු ලැබූ අවස්ථාවක ඔවුන්ගේ උප්පැන්න සහතික හෝ අනුමාන වයස පිළිබඳ සහතික ඉදිරිපත් කිරීමට සූදනම් වී සිටිය යුතුයි.

(ඒ) පත්කරනු ලබන අය දිවයිනෙහි ඕනෑම පෙදෙසක සේවය කළ යුතුයි.

4. **පළාත් පාලන සේවයට නව ප්‍රවේශක නිලධාරීහු.**—(i) අදළ පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත්කරනු ලැබූ නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය යම්කිසි තනතුරු වෙනුවෙන් වඩා දීර්ඝ කාලයක් නියමකොට නැත්නම් අවුරුදු 3ක් වන්නේය.

(ii) 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලටත්, ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා දනට පවත්නා වූත් හෝ මින්මතු සම්පාදනය කළහැකි වූ කිසියම් නියෝග හෝ නීතිරීතිවලට එකඟවීමේ කොන්දේසියට සියලුම නව ප්‍රවේශක නිලධාරීන් එකඟ විය යුතුය.

(iii) රාජකාරි කටයුතු කාර්යක්ෂම ලෙස ඉටුකිරීමෙහි ලා අත්‍යවශ්‍ය නොවන්නාවූ විශේෂ අවස්ථාවන්හිදී හැර, ඔවුන් සවකීය ආධුනික/වැඩ පරීක්ෂණ කාලපරිච්ඡේදය ඇතුළත රාජ්‍ය භාෂාව වන සිංහලෙන් වැඩ කිරීමේ දනුමක් ලබාගත යුතුය.

(iv) ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂණ කාලය අවසානයේදී පත්වීම ස්ථිර කිරීම, අනිකුත් කරුණු අතර, නියමිත කාලසීමාව තුළදී කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර තත්ත්වයට වඩා ඉහළ නොවන මට්ටමක් දක්වා වූ සිංහල පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණවලින් සමත්වීම උඩ රඳා පවතී. නියමිත කාලසීමා ඇතුළත දී මෙම පරීක්ෂණවලින් අසමත්වීමේ ප්‍රතිඵලයක් වශයෙන් එසේ නියමිත පරීක්ෂණවලින් සමත්වන තුරු, නියමිත වැටුප් වැඩවීම් නොගෙවනු ලබන අතර, ස්වකීය ආධුනික කාලය/වැඩ පරීක්ෂණ කාලය අවසාන වනවිට, සිංහල ප්‍රවීණතාවය පිළිබඳ නියමිත තත්ත්වය ලබා ගැනීමට අසමත් වන නිලධාරීන්ගේ සේවය අවසන් කරනු ලැබිය හැකිය.

(v) **අධ්‍යාපනික සහ අනිකුත් සුදුසුකම්.**—ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ ඊට උසස් විභාගයකින් හෝ සාමාර්ථ්‍යය අඩුම සුදුසුකම වශයෙන් නියමකොට ඇත්තා වූ සෑම බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටියකදීම සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ සිංහලයෙකු වන අයදුම්කරුට ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් ලබන ලද සිංහල භාෂාව පිළිබඳ හෝ ඊට සමාන විෂයයකින් සම්මානයක් තිබිය යුතුය.

(1963 පෙබරවාරි මස 8 වැනි දිනට පූර්ව වූ දිනයක සිට පළාත් පාලන සේවයේ සිටියා වූත්, පළාත් පාලන සේවයේ වෙනත් තනතුරු ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් කෙරෙහි මේ අවශ්‍යතාව අදළ නොවේ.)

සටහන.—(i) පළාත් පාලන සේවයට ඇතුලුවීම සඳහා සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබාගන්නා අය, තනතුර ස්ථිර කිරීම සඳහා පූර්ව අවශ්‍යතාවයක් වශයෙන් වූ සිංහල ප්‍රවීණතා පරීක්ෂණ සමත්වීමෙන් නිදහස් කරනු ලබති.

(ii) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා "නව ප්‍රවේශක" යන පදය අදල වනුයේ 1960.1.29 දින හෝ ඊට පසුව ප්‍රසිද්ධ කරන ලද ගැසට් නිවේදන අනුව පළාත් පාලන සේවයේ තනතුරුවලට පළමුවරට පත්කරනු ලබන නිලධාරීන්ටය.

(iii) රජයේ සේවයෙහි නියැලිව සිට, පළාත් පාලන සේවයේ තනතුරු භාරගැනීම සඳහා සේවයෙන් නිදහස් කරනු ලබන්නාවූ "ආදි ප්‍රවේශක නිලධාරීන්" කෙරෙහි ඉහත 4 වැනි ඡේදයේ (iii) හා (iv) දරණ ඡේදවල සඳහන් විධිවිධාන අදල නොවේ.

5. සෑම අයදුම්කරුවෙකු විසින්ම, තමා ලාංකිකයකු බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි. "ලාංකිකයා" යනු පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියෙකු වූවෙකි.

6. **සේවාමුක්ත භටයින් සඳහා අනුග්‍රහ.**—(අ) සේවාමුක්ත වූ අයදුම් කරුවනට, ඔවුන්ගේ නිත්‍ය භට හමුද සේවා කාලය, තම වයසින් අඩුකර ගැනීමෙන්, ඉල්ලුම්කර ඇති තනතුරුවල නියමිත උපරිම වයස් සීමාව ඇතුළතට පැමිණිය හැකිවන අවස්ථාවක නිත්‍ය භට සේවා කාලපරිච්ඡේදය එසේ අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

(ආ) සේවයේ යම්කිසි තනතුරක් සඳහා බඳවා ගැනීමේ ක්‍රියා පරිපාටියෙහි නියමිත අඩුම අධ්‍යාපන සුදුසුකම, ඊළඟට පහළින් ඇති විභාගය දක්වා අඩු කිරීමට සේවා මුක්තයන් වන අයදුම්කරුවනට අවසර දෙනු ලැබේ.

7. **වයස පිළිබඳ අනුග්‍රහය.**—පළාත් පාලන සේවයේ තනතුරු සම්බන්ධයෙන් පළ කෙරෙන පුරප්පාඩු සඳහා වයස් සීමාවන් ගැන නොතකාම අයදුම්පත් එවීමට ස්ථිර තනතුරක් දරණ, වර්ෂ දෙකක අඛණ්ඩ සේවාවක් ඇති ප්‍රාදේශීය බලමණ්ඩලයන්හි සේවකයන්ට පුළුවන.

8. **වෙනත් අවශ්‍ය කරුණු.**—(i) දනට පළාත් පාලන මණ්ඩලයක සේවයේ යෙදී සිටින නිලධාරීන් අයදුම්පත් තම තමන් සේවය කරන ප්‍රාදේශීය බලමණ්ඩල සභාපති මගින් හෝ නාගරික කොමසාරිස්වරයා මගින් හෝ ඉදිරිපත් කළ යුතුයි.

(ii) දනට ආණ්ඩුවේ සේවයෙහි යෙදී සිටින නිධලාරීන්ගේ අයදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන්ගේ මාර්ග යෙනි. ආණ්ඩුවේ සේවයේ ස්ථිර තනතුරු දරණ නිලධාරීන් එවන අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී, ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින්ම එම අයදුම්කරුවන් තෝරාගනු ලැබුවහොත්, ඔවුන් ස්වකීය තනතුරුවලින් මුදගන්නට තමන් සූදනම්ව සිටිද්ද නැද්දැයි සඳහන් කළ යුතුය.

(iii) සම්මුඛ පරීක්ෂණයක් හෝ ලිඛිත පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන ස්ථානයකට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකිය. මේ සම්බන්ධයෙන් කිසිම ගමන් වියදමක්, අන්කිසි වියදමක් හෝ ගෙවනු නොලැබේ.

(iv) කිසිම අපේක්ෂකයෙකු ගැන නිර්දේශයක් කිරීමට යම් තැනැත්තකුට වුවමනා නම්, ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයෙකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමේ වුවද අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බලපෑවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත්, ඒ හේතුවෙන්ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේය.

(v) යම් අයදුම්කරුවකුගේ අයදුම්පතෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන්කොට තිබෙන බැව් ඔහු තෝරාගැනීමට කලින් දැනගන්නට ලැබුණි නම්, ඒ හේතුවෙන්ම එම තනතුරට නුසුදුස්සකු බවට පත්කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වූනි නම්, රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

(vi) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නොගැළපෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(vii) පහත සඳහන් ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත (ඔහුගේ පෞද්ගලික නමට නොවේ) එවිය යුතුයි.

(viii) අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනයෙන් පසු මේ කාර්යාලයට ලැබෙන අයදුම්පත් සාමාන්‍යයෙන් සළකා බලනු නොලැබේ. අයදුම්පතක් තැපැලේදී ප්‍රමාද වූ බවට හෝ නැති වූ බවට කෙරෙන කිසිම පැමිණිල්ලක් සළකා බලනු නොලැබේ. අවසාන දිනය වනතුරු ස්වකීය අයදුම්පත් ඉදිරිපත් කිරීම ප්‍රමාද කරන අයදුම්කරුවෝ තුමූම ඒ අවදානමට මුහුණ පාති.

අනන්‍යාකාරයකින් සඳහන්කොට නැති කල්හි භාවිත කළ යුතු අයදුම්පත ආකෘතිය

## පළාත් පාලන සේවය

සැ.යු.—(i) අයදුම් පත්‍ර පහත සඳහන් ආකෘතියෙහි පිළියෙල කොට තනතුරු අදාළ වන ගැසට් නිවේදනයෙහි සඳහන්, අයදුම් පත්‍ර භාර ගන්නා අවසාන දින හෝ ඊට පළමු, කොළඹ 1, තැ. පෙ. 530, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන්නට එවිය යුතුයි. අයදුම් පත්‍ර, ලේකම්ගේ පෞද්ගලික නමට නොඑවිය යුතුයි.

(ii) තනතුරු ඉල්ලා සිටීම සඳහා තමා සාකල්‍යයෙන්ම සුදුසුබැව් නිශ්චය කරනු පිණිස, තම අයදුම්පත්‍ර පිළියෙල කිරීමට පළමු ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසි හා ගැසට් නිවේදනයේ අවශ්‍යතාද සැළකිල්ලෙන් කියවා බලන ලෙස අයදුම්කරුවන්ට අවවාද කරනු ලැබේ. ගැසට් නිවේදනය බලා අදළ සියලුම තොරතුරු සැපයීමට අයදුම්කරුවෝ වග බලාගත යුතුය.

(iii) පහත සඳහන් ලේඛනවල පිටපත්, අයදුම්කරුවෝ ස්වකීය අයදුම් පත්‍රවලට අමුණිය යුතුය. (1) ඉංග්‍රීසි, සිංහල, දෙමළ යන භාෂාවලින් සමත්වී ඇති උසස්ම විභාගය පිළිබඳ සහතිකය. (2) චරිත සහතිකය, (3) ඉල්ලා සිටින තනතුර සම්බන්ධයෙන් අදළවන වෘත්තීය/ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(iv) ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසිවල 8 වැනි ඡේදය කෙරෙහි විශේෂ සැළකිල්ල යොමු කරන්න.

### ——————තනතුර සඳහා වූ අයදුම් පත

1. (අ) පුරප්පාඩුව ප්‍රසිද්ධකොට ඇති ගැසට් පත්‍රයේ දිනය :————.
   (ආ) ඉල්ලුම්කර සිටින තනතුර :————.

2. සම්පූර්ණ නම පැහැදිලි අකුරෙන් :————.
   ජාතිය :————.
   (එම ලියාපදිංචිවීමෙන් ලාංකිකයෙකු වී නම්, පුරවැසිභාවය පිළිබඳ සහතිකයේ දිනයත්, සැදැහුම් අංකයත් සඳහන් කරන්න.)

3. තැපැල් ලිපිනය :————
   (ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි.)
   (අ) අයදුම් පත්‍ර භාරගන්නා අවසාන දිනයට නියම වයස :—
   අවුරුදු :———, මාස :———, දින :———.
   (ආ) උපන් දිනය :——.

| අවුරුද්ද | මාසය | දිනය |
|---|---|---|
| | | |

5. උපන් ස්ථානය :—
   (අ) අයදුම්කරු :————
   (ආ) අයදුම්කරුගේ පියා :————.
   (ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.
   (ඈ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තා :————.
   (අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ), (ආ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු ලංකාවේ නූපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ඇ) සහ (ඈ) පිරවිය යුතුය.)

6. විවාහකද ? අවිවාහකද ? වැන්දඹුද ? :————.

7. වයස අවුරුදු 12 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :—

| සාමාන්‍ය අධ්‍යාපනය | | |
|---|---|---|
| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා |
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

| වෘත්තීය/ශිල්පීය අධ්‍යාපනය | | |
|---|---|---|
| විද්‍යායතනය | සිට | දක්වා |
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

8. අධ්‍යාපන සුදුසුකම් හා අන්තිමට සමත් වූ විභාගය දිනයක් සමග :—
   (අ) සිංහල :————.
   (ආ) ඉංග්‍රීසි :————.
   (ඇ) දෙමළ :————.

9. ලබාගෙන ඇති වෘත්තීය සහ ශිල්පීය සුදුසුකම් ලැබූ දින හා ආයතනවල නම :————.

10. වෘත්තීය/කාර්මික/කර්මාන්ත පළපුරුද්ද :——.

| ආයතනයේ නම | ආධුනිකත්වයේ ස්වභාවය/දරූ තනතුර | සිට | දක්වා |
|---|---|---|---|
| | | | |

(සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි.)

11. (අ) පාඨශාලාවෙන් අස් වූ දින සිට කළ රක්ෂා (පත් වූ දිනයන් හා අස් වූ දිනයන් දක්වමින් දරූ තනතුරු සඳහන් කරන්න.) :————.

(ආ) මීට පළමු, ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලනායතනයක් යටතේ ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් හෝ රක්ෂාවෙහි යෙදී සිටියේ නම් සහ ඒ සේවය නතර කිරීමට ඇති හේතු හා එසේ කළ දින පැහැදිලි වශයෙන් දක්වන්න :————.

(ඇ) පළාත් පාලන ආයතනවල සේවා කාලය පිළිබඳ සටහන් (තනතුරු) පළාත් පාලනායතන හා කාල සීමාවන් :————.

(ඈ) දනට කරන රක්ෂාව—පහත සඳහන් විස්තර දෙන්න :—
   (i) තනතුරේ පදවි නාමය, ශ්‍රේණිය හා ඊට පත්වූ දිනය :————.
   (ii) දීමනා හැර දනට ලබන වැටුප හා වැටුප් ක්‍රමය :————.
   (iii) විශ්‍රාම වැටුප් සහිතද ? :————.

(ඉ) සේවා මුක්ත භටයෙක් නම්—සේනාංකය, තරාතිරම, සේවයට බැඳුන දිනය හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

12. කියවීම, ලිවීම, කථා කිරීම, භාෂණ පරිවර්තනය පිළිබඳව ප්‍රවීණතාවක් ඇද්ද :—
   (අ) සිංහල :————.
   (ආ) දෙමළ :————.

13. විශේෂ සුදුසුකම්.—ගැසට් නිවේදනයෙහි සඳහන්කොට ඇති විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට තිබේද? එසේනම්, ඒ පිළිබඳව සම්පූර්ණ විස්තර, දින වකවානු සහිතව සඳහන් කරන්න :————.

**14.** කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේද ? එසේනම් දිනය, නඩු අංකය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

**15.** මුදල් කරදරවලින් නිදහස්ද? එසේ නැත්නම්, ඔබේ ණය බැඳීම්වල ප්‍රමාණය කෙතෙක් ද ? :————.

**16.** වෙනත් විස්තර (විශේෂ හිමිකම් ආදිය) :————.

**17.** චරිත සහතික ලබාගත් අයගේ නම් සහ පදවි නාම :————.

(ඉදිරිපත් කළ යුත්තේ ඒ සහතිකවල මුල් ලිපි නොව, පිටපත් පමණි. පළාත් පාලන සේවයේ උපලේඛනගත තනතුරු දරණ සාමාජිකයින් විසින් මේ නියමයේ ප්‍රකාර ක්‍රියා කළ යුතු නොවේ.)

මේ අයදුම් පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයාගනු ලැබුවහොත්, මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත්, වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්,
තැ. පෙ. 530, කොළඹ 1.

---

## පළාත් පාලන සේවය

### කාර්යාල කාර්ය සහායක තනතුර—තලාහේන ගම්සභාව

ඉහත සඳහන් තනතුර සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ.

2. වැටුප් ක්‍රමය.—වර්ෂයකට රුපියල් 540—8×30—1×24—804 වැටුප් ක්‍රමය මත රු. 2,208—9×54—2,694 ඒකාබද්ධ වැටුප් ක්‍රමය ගෙවනු ලැබේ. මීට අමතරව රජයේ ප්‍රමාණයන් හා කොන්දේසි අනුව විවාහ දීමනාවක් ද ගෙවනු ලැබේ.

3. අවශ්‍ය සුදුසුකම්—

(අ) වයස : 1970. 11. 30 වෙනි දිනට වයස අවුරුදු 18 කට නොඅඩු 30 කට නොවැඩි විය යුතුයි.

(ආ) අඩු වශයෙන් අයදුම්කරුවන් සිංහල කණිෂ්ඨ ප්‍රමාණයෙන් වත් සමත් වී සිටිය යුතුයි.

(ඇ) තලාහේන ගම්සභාව සීමාව තුල ස්ථිර පදිංචිය ඇති ලාංකික පුරවැසියන් ගැන විශේෂයෙන් සලකා බලනු ලැබේ.

4. පළාත් පාලන සේවා සමාජිකයින්ගේ හා ප්‍රාදේශීය බලමණ්ඩල වල ස්ථිර සේවයේ සිටින සේවකයින්ගේ අයදුම් පත්‍ර, ඔවුන් අතින් සුදුසුකම් ලබා ඇත්නම්, වයස පිළිබඳ නියමය නොතකා සලකා බලනු ලැබේ.

5. මේ ගැසට් පත්‍රයේ IV වෙනි කොටසේ ආරම්භයේ පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත් කිරීම සම්බන්ධයෙන් අදාල සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. ඉල්ලුම් පත්‍ර, පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව සාරානුකූලව පිළියෙල කොට 1970. 11. 30 වන දිනට හෝ ඊට පළමු තලාහේන ගම්සභාවේ සභාපති වෙත ලැබෙන්නට එවිය යුතුයි.

ආස්. පිලිප් රෝසා,
තලාහේන ගම්සභාවේ සභාපති.

1970 ඔක්තෝබර් 31 වන දින දීය,
ගම්සභා කාර්යාලය,
තලාහේන, මීගමුව.

11-442—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන සේවය

### කාර්යාල කාර්ය සහායක තනතුර—ගලේවෙල සුළු නගර සභාව

ඉහත සඳහන් තනතුර සඳහා අයදුම් පත්‍ර කැඳවනු ලැබේ.

2. වැටුප් ක්‍රමය.—වර්ෂයකට රුපියල් 540—30×8—රුපියල් 24×1—804—රුපියල් 636 සහ රුපියල් 732 යන වාර්ෂික වැටුප්වලට පළමු කාර්යක්ෂමතා කඩඉම් ඇත.

3. අවශ්‍ය සුදුසුකම්—

(අ) වයස : 1970 නොවැම්බර් 30 වැනි දිනට වයස අවුරුදු 20 ට නොඅඩු 30 ට නොවැඩි විය යුතුයි.

(ආ) අපේක්ෂකයෝ සිංහල/දෙමළ 6 වැනි ප්‍රමාණයෙන් සමත්ව සිටිය යුත්තාහ.

4. පළාත් පාලන සේවා සාමාජිකයන්ගේ හා ප්‍රාදේශීය බල මණ්ඩලවල ස්ථිර සේවයේ සිටින සේවකයන්ගේ අයදුම් පත්‍ර ඔවුන් අනිත් සුදුසුකම් ලබා ඇත්නම්, වයස පිළිබඳ නියමය නොතකා සලකා බලනු ලැබේ.

5. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයේ පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම සම්බන්ධයෙන් අදාලවන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. ඉල්ලුම් පත්‍ර, පත්කිරීම සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව සාරානුකූලව පිළියෙලකොට, 1970 නොවැම්බර් 30 දිනට හෝ ඊට පළමු ගලේවෙල සුළු නගර සභාවේ සභාපති වෙත ලැබෙන්නට එවිය යුතුයි.

ල. ජ. ද සිල්වා වික්‍රමසූරිය,
ගලේවෙල සුළු නගර සභාවේ සභාපති.

1970 ඔක්තෝබර් මස 25 වැනි දින,
ගලේවෙල සුළු නගර සභා කාර්යාලයේදීය.

11-480—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

---

## අය – වැය ලේඛන

### බේරුවල නගර සභාව

**1970 වර්ෂයේ 2 වන අතිරේක වැය ලේඛනය**

| ශීර්ෂය හා වියදම් උප ශීර්ෂය | ගණන රු. | ශ. | අනුමතය |
|---|---|---|---|
| ඒ—1 (ඊ) විශ්‍රාම වැටුප් ... ... ... ... | 2,250 | 0 | ...1970 අගෝස්තු මස 28 වන දින යෝජනා අංක 14 |
| ඒ—2 (බී) ගමන් වියදම් ... ... ... ... | 750 | 0 | ... එම |
| බී—8. අළුත්වැඩියා කිරීම ... ... ... ... | 2,250 | 0 | ...1970 සැප්තැම්බර් 21 වන දින යෝජනා අංක 11 |
| ඊ—1 (ඇෆ්) මාතෘ නිවාසය හා ළමා සායනය ... ... ... | 2,000 | 0 | ... එම |

ඇම්. ඒ. බාකීර් මාකාර්,
සභාපති,
බේරුවල නගර සභාව.

1970 නොවැම්බර් 1 දින,
බේරුවල නගර සභා කාර්යාලයේදීය.

11-453/1—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

## බේරුවල නගර සභාව

### නගර සභා මුදල් රෙගුලාසි 12 (II) යටතේ අයදුම්පත

### 1970 අය වැය ලේඛනය

1970 අය වැය ලේඛනයේ පහත සඳහන් වැය ශීර්ෂයන් යටතේ ඉතිරි වේ යැයි ගණන් බලන ලද ඊට අනුරූපව දක්වෙන වැය ශීර්ෂයන්ට මාරුකර අවශ්‍යව තිබෙන අතිරේක වැය සඳහා එම ශීර්ෂ යටතේ යෙදවීමට 1970 ඔක්තෝබර් මස 21 වන දින පවත්වන ලද මාසික සභා රැස්වීමේ අංක 16 දරණ සම්මුතියෙන් සභා සම්මත විය.

| ඉතිරි වන වැය ශීර්ය | රු. | ශ. | වැඩියෙන් වැය වන වැය ශීර්ෂය | රු. | ශ. |
|---|---|---|---|---|---|
| ඒ—2 (ඩී) තක්සේරු ගාස්තු | 500 | 0 | ඒ—1 (ඒ) ලේකම්ගේ වේතන | 750 | 0 |
| බී—1 (ඒ) වේතන—වැඩ අධිකාරී | 500 | 0 | ඒ—1 (බී) ලිපිකරු වේතන | 2,000 | 0 |
| බී—7. පවරා ගැනීම | 2,000 | 0 | ඒ—1 (ඊ) විශ්‍රාම වැටුප් | 2,000 | 0 |
| බී—9. ණය ආපසු ගෙවීම | 400 | 0 | ඒ—2 (බී) ගමන් වියදම්... | 500 | 0 |
| බී—11. මිණුම් ගාස්තු | 500 | 0 | ඒ—2 (සී) එකතු කරන්නන්ගේ කොමිස් | 2,000 | 0 |
| බී1—6. විවාහක දීමනා | 100 | 0 | ඒ—2 (ඊ) නීතිඥ ගාස්තු | 2,000 | 0 |
| ඩී—7. ණය ගාස්තු | 4,900 | 0 | ඒ—2 (ඇප්) ලිපි ද්‍රව්‍ය යනාදිය | 2,000 | 0 |
| ඊ—1 (ඒ) වේතන | 1,500 | 0 | ඒ—2 (එච්) බයිසිකල් තහඩු | 350 | 0 |
| ඊ—1 (සී) නිල ඇඳුම් | 300 | 0 | ඒ—2 (ඇල්) කාර්‍යාලයීය බඩු බාහිරාදිය | 1,000 | 0 |
| ඊ—1 (ඊ) විෂ බීජ නාශක | 750 | 0 | ඒ—2 (ඇන්) අතිකාල දීමනා | 500 | 0 |
| ඊ—1 (අයි) සෞඛ්‍ය සතියේ වියදම් | 300 | 0 | ඒ—2 (ඕ) විවාහක දීමනා | 350 | 0 |
| ඊ—1 (ඉසැඩ්) විවාහක දීමනා | 300 | 0 | ඒ—2 (අයි) ගණන් පරීක්ෂණ ගාස්තු | 1,100 | 0 |
| ඊ—2 (එච්) විවාහක දීමනා | 475 | 0 | බී—1 (බී) ඕවර්සියර්ගේ වේතන | 500 | 0 |
| ඊ—3 (ඒ) වේතන | 4,000 | 0 | බී—1 (සී) කම්කරු වේතන | 7,000 | 0 |
| ඊ—3 (ඊ) වැසිකිළි නඩත්තු කිරීම | 1,500 | 0 | බී—3. යන්ත්‍රෝපකරණ | 2,000 | 0 |
| ඊ—3 (ජී) ගොඩනැගිම | 3,000 | 0 | බී—8. අළුත්වැඩියා කිරීම | 3,500 | 0 |
| ඊ—3 (ජේ) විවාහක දීමනා | 450 | 0 | ඩී—1. වේතන | 35 | 0 |
| ඇප්—1. වේතන | 6,800 | 0 | ඩී—5. ගෘහ භාණ්ඩ | 750 | 0 |
| ඇප්—2. නඩත්තු කිරීම | 2,000 | 0 | සී—11. විවාහක දීමනා | 150 | 0 |
| ඇප්—4. පවරා ගැනීම | 500 | 0 | ඊ—1 (ඇප්) මාතෘ හා ළමා සායනය | 1,500 | 0 |
| ජේ—4 (ඊ) ගණන් පරීක්ෂණ ගාස්තු | 1,490 | 0 | ඊ—2 (බී) ලොරි සහ කරත්ත | 1,250 | 0 |
| ඇම්—1. වේතන | 3,500 | 0 | ඊ—2 (සී) ගබඩා | 750 | 0 |
| ඇම්—4. නඩත්තු කිරීම | 2,000 | 0 | ඊ—2 (ජී) ගොඩනැගිම් | 750 | 0 |
| ඇම්—7. විවාහක දීමනා | 120 | 0 | ඊ—4 (සී) එම | 650 | 0 |
| | | | ඊ—7 (බී) නඩත්තු කිරීම | 1,000 | 0 |
| | | | ජේ—4 (එච්) දුම්රිය බලපත්‍ර ගාස්තු | 500 | 0 |
| | | | ජේ—4 (ජේ) විශ්‍රාම වැටුප් | 2,500 | 0 |
| | | | ඇම්—2. පොත් සහ සඟරා | 500 | 0 |
| එකතුව | 37,885 | 0 | | 37,885 | 0 |

ඇම්. ඒ. බාකිර් මාකාර්,
සභාපති,
බේරුවල නගර සභාව.

1970 නොවැම්බර් 1,
නගර සභා කාර්‍යාලය,
බේරුවල.

11–453/2—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

---

## හික්කඩුව සුළු නගර සභාව

### අංක 40 (II) දරණ සුළු නගර සභා මුදල් නියෝගය යටතේ කෙරෙන ඉල්ලීම

### 1970 අය වැය ලේඛනය

1970 වර්ෂයේ ප්‍රතිපාදිත වැය ශීර්ෂයන්ගෙන් ඉතිරි වේ යයි ගණන් බලන ලද මුදල් භාවිතයෙන් අන්‍ය වැය සම්මතයන්හි අවශ්‍ය වියදම් පියවා ගැනීම, 1970 ඔක්තෝබර් මස 28 වැනි දින පවත්වන ලැබූ හික්කඩුව සුළු නගර සභාවේ මාසික රැස්වීමේදී අංක 4 දරණ යෝජනා ස්ථිරත්වය අනුව පහත සඳහන් අන්දමට සම්මත කර ගන්නා ලදී.

#### පළමුවැනි කොටස—සාමාන්‍ය

| ඉතිරි වැය | රු. | ශ. | අතිරේක ප්‍රතිපාදන | රු. | ශ. |
|---|---|---|---|---|---|
| ඒ—1 (ඇfජ්) විශ්‍රාම වැටුප් | 350 | 0 | ඒ—1 (සී) ඕවර්සියර් වැටුප් | 60 | 0 |
| ඒ—2 (ඒ) දීමනා | 200 | 0 | ඒ—1 (ජී) ජීවන හා වි. ජීවනාධාර | 80 | 0 |
| ඒ—2 (ඊ) නීතිඥ ගාස්තු | 250 | 0 | ඒ—2 (බී) ගමන් ගාස්තු... | 400 | 0 |
| බී—8. ප්‍රතිසංස්කරණය | 1,000 | 0 | ඒ—2 (සී) අයකැමි ගාස්තු | 200 | 0 |
| ඩී—2 (එච්) ජල සම්පාදනය | 550 | 0 | ඒ—2 (ඇප්) ලිපි ද්‍රව්‍ය | 500 | 0 |
| ජේ—1. කියවීම් ශාලා | 1,890 | 0 | ඒ—2 (කේ) උපකරණ | 1,400 | 0 |
| | | | බී—4. වීථි ආලෝකය | 300 | 0 |
| | | | ඩී—1 (ඒ) (3) වින්නඹු මාතාවෝ | 180 | 0 |
| | | | ඩී—2 (ඇප්) අතුරු දීමනා | 20 | 0 |
| | | | ඩී—6 (බී) රෝහල් නඩත්තු | 1,100 | 0 |
| එකතුව | 4,240 | 0 | එකතුව | 4,240 | 0 |

#### දෙවැනි කොටස—විදුලිය

| | | | | | |
|---|---|---|---|---|---|
| වී—5 (බී) මුල් මුදල් ආපසු ගෙවීම | 7,340 | 0 | වී—1 (ඩී) විදුලි බලය මිළයට ගැනීම | 7,300 | 0 |
| | | | වී—4 (සී) මුද්‍රණ හා ලිපි ද්‍රව්‍ය | 40 | 0 |
| එකතුව | 7,340 | 0 | එකතුව | 7,340 | 0 |

බී. ජේ. වීරසේකර,
සභාපති,
හික්කඩුව සුළු නගර සභාව.

1970 ඔක්තෝබර් මස 30 වැනි දින,
හික්කඩුව සුළු නගර සභා කාර්‍යාලයේදීය.

11–455—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

## අවිස්සාවේල්ල පළාත් ආණ්ඩු සභාව

### 1970 වර්ෂයේ 7 වන පරිපූරක අය වැය ලේඛණය

| වැය ශීර්ෂය | ගණන | යෝජනා අංකය හා දිනය |
|---|---|---|
| | රු. ශ. | |
| ජේ—විදුලි දෙපාර්තමේන්තුව :— | | |
| (3) කම්බිවලට සහ නිවෙස්වලට යා කිරීමේ සේවයන්— | | 1970.10.31 වෙනි දින පවත්වන ලද මාසික රැස්වීමේ අංක 2 (12) දරන සභා සම්මතය |
| (ඒ) ද්‍රව්‍ය ... ... ... ... | 6,560 50 | |
| | 6,560 50 | |

වර්ෂ 1970 ක් වූ ඔක්තෝබර් මස 31 වෙනි දින පවත්වන ලද මාසික රැස්වීමේදී අංක 2 (12) දරන සභා සම්මතයෙන් ඒකමතිකව සහා සම්මත වී තිබේ.

ආනන්ද සෝමවීර,
සභාපති,
අවිස්සාවේල්ල පළාත් ආණ්ඩු සභාව.

පළාත් ආණ්ඩු සභා කාර්‍යාලය,
අවිස්සාවේල්ල, 1970.10.31.

11–438/1—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

---

## අවිස්සාවේල්ල පළාත් ආණ්ඩු සභාව

### මුදල් රෙගුලාසි 12 (II) යටතේ කෙරෙන අයදුම් පත්‍රය

### 1970 අය වැය ලේඛනය

1970 අය වැය ලේඛනයේ ඒ ඒ ශීර්ෂයන් යටතේ වෙන් කරන ලද මුදල්වලින් ඉතිරි වේ යයි ගණන් බලන ලද පහත දැක්වෙන වැය ශීර්ෂ යටතේ සඳහන් මුදල් ඊට අනුරූපව දැක්වෙන වැය ශීර්ෂවලට මාරු කර, අවශ්‍ය වී තිබෙන අතිරේක වැය සඳහා එම ශීර්ෂය යටතේ යෙදීමට 1970 ක් වූ ඔක්තෝබර් මස 31 වෙනි දින පවත්වන ලද අවිස්සාවේල්ල පළාත් ආණ්ඩු සභාවේ මාසික රැස්වීමේ අංක 2 (13) දරන සභා තීරණයෙන් සම්මත වී තිබේ.

**1970 අය වැය ලේඛනයේ වෙන් කර තිබෙන මුදල් වලින් ඉතිරි වේ යයි ගණන් බලන ලද ශීර්ෂයන් හා මුදල්**

| | රු. | ශ. |
|---|---|---|
| ඒ—සාමාන්‍ය වියදම් :— | | |
| 1. නිලධාරීන්ගේ වැටුප් (අන් තැනක වැය නොවන) | | |
| (බී) ලිපිකරුවන් හා ආදායම් පරීක්ෂකවරුන් ... | 7,000 | 0 |
| (සී) කාර්‍යාල කාර්‍ය සහායකයින් ... ... | 1,500 | 0 |
| 2. කාර්‍ය මණ්ඩලීය වියදම් :— | | |
| (ඒ) අමතර දීමනා ... ... ... | 300 | 0 |
| (ඊ) අධිකරණ ගාස්තු ... ... | 1,000 | 0 |
| (එච්) කරත්ත, ඔරු සහ වරිපනම් නොමමර තහඩු පිළිබඳ වියදම් ... ... ... | 250 | 0 |
| (අයි) ගණන් පරීක්ෂක ගාස්තු ... ... | 2,900 | 0 |
| (ඕ) විවාහ දීමනා ... ... ... | 250 | 0 |
| 4. ආධාර සහ දීමනා :— | | |
| (ඒ) (ආ) ප.පා.කො. තුමාගේ චක්‍රලේඛය අනුව ශිෂ්‍යත්ව 2 සඳහා ... ... ... | 1,000 | 0 |
| (සී) සංස්කෘතික උත්සව සඳහා ප්‍රජා පිළිගැනීම් ආදිය ... | 700 | 0 |
| (ඊ) ගංවතුරෙන්, වැස්සෙන්, ගින්නෙන්, වසංගතවලින් සහ දුර්භික්ෂවලින් වන ආපද ... ... | 750 | 0 |
| (ඇෆ්) ආහාර නිෂ්පාදන කටයුතු පිළිබඳ වියදම් ... | 500 | 0 |
| බී.—මංමාවත් :— | | |
| 1. වැටුප් සහ පඩිනඩි— | | |
| (සී) කම්කරුවෝ ... ... ... | 5,000 | 0 |
| 7. ඉඩම් ලබා ගැනීම ... ... | 1,500 | 0 |
| 11. මැනීම් ... ... ... | 500 | 0 |
| 12. අළුත් වැඩ ... ... ... | 5,000 | 0 |
| 14. අතිරේක දීමනා ... ... ... | 1,800 | 0 |
| සී.—තානායම් :— | | |
| 2. නඩත්තුව ... ... ... | 1,000 | 0 |
| 8. විවාහ දීමනා ... ... ... | 300 | 0 |
| ඩී.—නගර සභා ඉඩම් සහ ගොඩනැගිලි :— | | |
| 1. වැටුප් ... ... ... | 500 | 0 |
| 5. දුව භාණ්ඩ ... ... ... | 1,000 | 0 |
| 6. ණය ගෙවීම— | | |
| (ඒ) පොලිය ... ... ... | 3,650 | 0 |
| 9. අතිරේක දීමනා ... ... ... | 1,000 | 0 |
| ඊ.—මහජන සෞඛ්‍ය :— | | |
| 1. සාමාන්‍ය— | | |
| (ඒ) පරීක්ෂකවරුන්ගේ සහ වින්නඹු මාතාවන්ගේ පඩි | 3,000 | 0 |
| 2. කුණු කසල බැහැර ලීම— | | |
| (එෆ්) අතිරේක දීමනා ... ... | 1,000 | 0 |
| 3. වැසිකිළි සුද්ධ කිරීම— | | |
| (ඊ) වැසිකිළි නඩත්තුව ... ... | 500 | 0 |
| (අයි) අතිරේක දීමනා ... ... | 1,000 | 0 |
| 5. ජල සම්පාදනය— | | |
| (ඒ) පඩිනඩි ... ... ... | 2,000 | 0 |
| 6. ආරෝග්‍ය ශාලාව—නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාව– | | |
| (එෆ්) අමතර දීමනා ... ... | 400 | 0 |
| ජේ.—විදුලි දෙපාර්තමේන්තුව :— | | |
| 11. අතිරේක දීමනා ... ... ... | 1,000 | 0 |
| ඇම්.—කියවීම් ශාලා සහ පුස්තකාල :— | | |
| 7. අතිරේක දීමනා ... ... ... | 450 | 0 |
| | 46,750 | 0 |

**අතිරේක වැය අවශ්‍ය වී තිබෙන ශීර්ෂයන් හා මුදල්**

| | රු. | ශ. |
|---|---|---|
| ඒ—සාමාන්‍ය වියදම් :— | | |
| 1. නිලධාරීන්ගේ වැටුප් (අන් තැනක වැය නොවන)— | | |
| (ඊ) විශ්‍රාම වැටුප් ... ... ... | 500 | 0 |
| 2. කාර්‍ය මණ්ඩලීය වියදම්— | | |
| (ඇල්) අතිකාල දීමනා ... ... | 750 | 0 |
| බී.—මංමාවත් :— | | |
| 8. සංවර්ධනය ... ... ... | 3,500 | 0 |
| සී.—තානායම :— | | |
| 7. ණය ගෙවීම— | | |
| (ඒ) පොලිය ... ... ... | 675 | 0 |
| (බී) කොටස් මුදල ... ... | 750 | 0 |
| ඩී.—නගර සභා ඉඩම් සහ ගොඩනැගිලි :— | | |
| 6. ණය ගෙවීම— | | |
| (බී) ණය මුදලෙන් ගෙවන කොටස ... ... | 4,200 | 0 |
| ඊ.—මහජන සෞඛ්‍යය :— | | |
| 1. සාමාන්‍ය— | | |
| (බී) අමතර දීමනා ... ... | 800 | 0 |
| 3. වැසිකිළි ශුද්ධ කිරීම— | | |
| (ඒ) පඩිනඩි ... ... ... | 5,625 | 0 |
| (බී) කරත්ත, ගොනුන් සහ ලොරි ... ... | 1,000 | 0 |
| 5. ජල සම්පාදනය— | | |
| (සී) නඩත්තුව ... ... ... | 500 | 0 |
| 6. ආරෝග්‍යශාලාව—නිදහස් ආයුර්වේද බෙහෙත්ශාලාව– | | |
| (බී) නඩත්තුව ... ... ... | 4,825 | 0 |
| 7. වෙළඳපලවල් සහ ගාල්— | | |
| (බී) නඩත්තුව ... ... ... | 6,850 | 0 |
| (ජී) ණය ගෙවීම— | | |
| (ඒ) පොලිය ... ... ... | 1,350 | 0 |
| (බී) ණය මුදලෙන් ගෙවන කොටස ... ... | 800 | 0 |
| (ජේ) විදුලි දෙපාර්තමේන්තුව :— | | |
| 4. පාලනය සහ සාමාන්‍ය වියදම්— | | |
| (බී) පඩි නඩි (පිට වැඩ කරන්නන්ට) ... | 3,500 | 0 |
| 5. ණය ගෙවීම— | | |
| (බී) ණය මුදලෙන් ගෙවන කොටස ... ... | 11,125 | 0 |
| | 46,750 | 0 |

ආනන්ද සෝමවීර,
සභාපති,
අවිස්සාවේල්ල පළාත් ආණ්ඩු සභාව.

පළාත් ආණ්ඩු සභා කාර්‍යාලය,
අවිස්සාවේල්ල, 1970.10.31.

11–438/2—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

# විවිධ දැන්වීම්

## බදුල්ල මහ නගර සභාව

**1970 වර්ෂය සඳහා වූ අංක 1 දරණ පරිපූරක අයවැය ලේඛණය**

බදුල්ල මහ නගර සභාවේ 1970 වර්ෂය සඳහා වූ 1 වෙනි පරිපූරක අයවැය ලේඛණය 1970 නොවැම්බර් මස 20 වෙනි දින සිට දින හතක් පොදු පරීක්ෂණය සඳහා බදුල්ල මහ නගර සභා කාර්යාලයේ විවෘතව තබන බව, සංශෝධිත ලංකා නීති ප්‍රඥප්තියේ 252 අධිකාරය වන මහ නගර සභා ආඥාපනතේ 214 (2) කී වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

පී. ඩබ්ලිව්. ද සිල්වා,
බදුල්ල නගරාධිපති.

1970 නොවැම්බර් මස 1 වෙනි දින,
බදුල්ල මහ නගර සභා කාර්යාලයේදීය.

11–435—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

---

## වත්තල-මාබෝලෙ නගර සභාව

**1971 වර්ෂය සඳහා දේපල බද්ද**

### නගර සභා ආඥාපනත

නගර සභා ආඥාපනතේ (255 අධිකාරිය) 160 වන වගන්තිය යටතේ 1971 වර්ෂයට වත්තල-මාබෝලෙ නගර සභා සීමාව තුළ දේපළ බද්ද අය කිරීම සඳහා 1970 වර්ෂයේ දේපල තක්සේරුවම බලපාන බවත්, එම වාර්ෂික තක්සේරුවෙන් සියයට 10 ක දේපළ බද්දක් සියලුම නිශ්චල දේපලවලින් අය කිරීමටත් එම බද්ද සමාන කාර්තු 4 ක් වශයෙන් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනයන්හිදී හෝ එයට පෙරාතුව අය කර ගැනීමටත් වත්තල-මාබෝලෙ නගර සභාව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

පී. ආර්. පර්සි ඩයස්,
සභාපති,
වත්තල-මාබෝලෙ නගර සභාව.

1970 නොවැම්බර් මස 1 වැනි දින,
වත්තල-මාබෝලෙ නගර සභා කාර්යාලය.

11–468—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

---

## වැලිගම නගර සභාව

**බල්ලන් ලියාපදිංචි කිරීමේ ආඥාපනත (477 වෙනි පරිච්ඡේදය)**

වැලිගම නගර සභාවේ පාලන බල සීමාව තුළ බල්ලන් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (477 වෙනි අධිකාරය) 4 වෙන වගන්තිය යටතේ, ඒ වෙනුවෙන් නියම බලධරයා වන වැලිගම නගර සභාපති විසින් සම්පාදනය කරන ලද උප නීතිය.

හෙන්රි දළුවත්ත,
සභාපති,
නගර සභාව, වැලිගම.

1970 නොවැම්බර් 2 දින,
වැලිගම නගර සභා කාර්යාලයේ දීය.

### උප නීතිය

වැලිගම නගරබද පළාත් සභාව විසින් සම්පාදනය කරනු ලැබ, 1937 අගෝස්තු 20 වෙනි දින අංක 8,310 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළකරන ලද උප නීති, වැලිගම නගර සභාවට අදාල වන තරමට, එහි 2 වෙනි උප නීතිය,

| | | |
|---|---|---|
| " බල්ලන් පිරිමි සතෙකුට | ... | රුපියල් 1 0 |
| බල්ලන් ගැණු සතෙකුට | ... | රුපියල් 1 50 " |

යන වචන සහ ඉලක්කම් වෙනුවට

| | | |
|---|---|---|
| " බල්ලන්ගේ පිරිමි සතෙකුට | ... | රුපියල් 5 0 |
| බල්ලන්ගේ ගැණු සතෙකුට | ... | රුපියල් 5 0 " |

යන වචන ආදේශ කිරීමෙන් සංශෝධනය කරනු ලැබේ.

11–470—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

---

## කොළොන්නාව නගර සභාව

1970 සැප්තැම්බර් මස 24 වෙනි දින අංක 14,924/6 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ (IV වෙනි කොටස—අති විශේෂ) පළ කරන ලද මුදල් රෙගුලාසි අංක 12(II) යටතේ කෙරෙන ''මුදල් ඉතිරිවේයයි ගණන් බලා ඇති වැය ශිර්ෂ'' යටතේ—

| | | | රු. |
|---|---|---|---|
| ඒ. 1 (බී) වැඩ අධිකාරි වැටුප් | ... | ... | 3,000 |
| ජේ. 2 (ඒ) විදුලි බල දෙපාර්තමේන්තුව ද්‍රව්‍ය | ... | ... | 4,000 |

යන්න

| | | | රු. |
|---|---|---|---|
| බී. 1 (ඒ) වැඩ අධිකාරි වැටුප් | ... | ... | 3,000 |
| ජේ. 3 (ඒ) විදුලිබල දෙපාර්තමේන්තුව ද්‍රව්‍ය | ... | ... | 4,000 |

යනුවෙන් නිවැරදි විය යුතුය.

ගලගෙදරගේ සෝමසිරි,
සභාපති,
කොළොන්නාව නගර සභාව.

1970 නොවැම්බර් මස 2 වෙනි දින,
කොළොන්නාව නගර සභා කාර්යාලය,
වැල්ලම්පිටිය.

11—428—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

---

## වරකාපොල සුලු නගර සභාව

**1971 වර්ෂයට දේපල බද්ද**

සුළු නගර සභා ආඥාපනතේ 256 වන අධිකාරය යටතේ ගතවී යන 1970 වර්ෂයට බලපවත්වන පහත සඳහන් වරිපනම් බදු 1971 වර්ෂයටද එලෙසම පැනවීමට වරකාපොල සුළු නගර සභාව තීරණය කර ඇති බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

159 වැනි වගන්තිය ප්‍රකාර මෙම සුළු නගර සභා සීමාව තුළ පිහිටා තිබෙන සියළුම නිශ්චල දේපලවලට වාර්ෂික වටිනාකමින් සියයට හය බැගින් වාර්ෂික බදු පිළිවෙලින් මාර්තු 31 වෙනිදයින්, ජූනි 30 වෙනිදයින්, සැප්තැම්බර් 30 වෙනිදයින් හා දෙසැම්බර් 31 වෙනිදයින් අවසන් වන අයුරින් කාර්තු වශයෙන් ගෙවිය හැකිවේ.

ඩබ්. ඒ. ඇල්බට්,
සභාපති,
වරකාපොල සුලු නගර සභාව.

1970 ඔක්තෝබර් 31 වෙනි දින,
වරකාපොල,
සුලු නගර සභා කාර්යාලයේ දී ය.

11–460—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

---

## කහවත්ත නගරය

**සුළු නගර සභා ආඥාපනත (256 වැනි අධිකාරය)**

### 1971 වර්ෂය සඳහා දේපල බද්ද

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනත යටතේ ගතවී යන මෙම වර්ෂයට බල පවත්නා පහත සඳහන් බදු 1971 වර්ෂයට ද එලෙසම පැනවීමට කහවත්ත නගරයේ විශේෂ කොමසාරිස්වරයා තීරණය කර ඇති බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

159 (2) වැනි වගන්තිය ප්‍රකාර මෙම නගරය තුළ පිහිටා තිබෙන සියලුම නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමින් සියයට හය බැගින් වාර්ෂික බදු පිළිවෙලින් මාර්තු 31 වැනිදයින්, ජූනි 30 වැනිදයින්, සැප්තැම්බර් 30 වැනිදයින් සහ දෙසැම්බර් 31 වැනිදයින් අවසන් වන අයුරු කාර්තු වශයෙන් ගෙවිය හැකිවේ.

ඒ. ආර්. කරුණාරත්න,
විශේෂ කොමසාරිස්,
කහවත්ත නගරය.

1970 ඔක්තෝබර් මස 26 දින,
කහවත්ත නගරයේ
විශේෂ කොමසාරිස් කාර්‍යාලයේ දීය.

11–462—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

## කහවත්ත නගරය

**256 වන අධිකාරය වන සුළු නගර සභා ආඥාපනත**

### 1971 වර්ෂය සඳහා රථවාහන හා සතුන් පිළිබඳ බද්ද

කහවත්ත නගරයේ විශේෂ කොමසාරිස් විසින් ප්‍රකාශයට පත් කරනු ලබන්නේ—

(1) 256 වැනි අධිකාරය වන උප නගර සභා ආඥාපනතේ අංක 161 (1) දරණ වගන්තිය යටතේ පහත උපලේඛනයෙහි විස්තර වන ගණන් අනුව 1971 අවුරුද්දට රථ වාහන හා සතුන් සඳහා බද්දක් පනවා අය කිරීමටද,

(2) එකී ආඥාපනතේ 162 (3) වැනි වගන්තිය යටතේ එකී බදු 1971 මාර්තු 31 වැනි දිනට හෝ ඊට ප්‍රථම ගෙවිය හැකි අයුරින්ද වේ.

ඒ. ආර්. කරුණාරත්න,
විශේෂ කොමසාරිස්,
කහවත්ත නගරය.

1970 ඔක්තෝබර් මස 26 දින,
කහවත්ත නගරයේ
විශේෂ කොමසාරිස් කාර්යාලයේ දිය.

### උපලේඛනය

| | රු. ශ. |
|---|---|
| මෝටර් කාර්, මෝටර් රෝදත්‍රයේ කාර්, මෝටර් ලොරි, මෝටර් පාපැදි, කරත්ත, අත් කරත්ත, ජින් රික්ෂෝ රථ, පාපැදි හෝ රෝදත්‍රයේ පාපැදි හැර වෙනයම් ඕනෑම වාහනයක් සඳහා ... ... | 5 0 |
| සෑම පාපැදියක්ම, රෝත්‍රයේ පාපැදියක් හෝ පාපැදි මෝටර් රථයක් හෝ කරත්තයක්— | |
| (ඒ) වෙළඳාම සඳහා පාවිච්චි කරනු ලබන්නේ නම්, ... ... | 5 0 |
| (බී) වෙළඳාම හැර වෙනත් කටයුතු සඳහා පාවිච්චි කරනු ලබන්නේ නම් ... | 1 0 |
| සෑම ගොන් බඳින කරත්තයක් සඳහා ... | 4 0 |
| සෑම අත්කරත්තයක් සඳහා ... ... | 4 0 |
| සෑම ජින් රික්ෂෝවක් සඳහා ... ... | 2 50 |
| සෑම අශ්වයෙක්, පෝනියෙක් හෝ කොටළුවෙකුට ... | 5 0 |
| සෑම බූරුවෙකුට හෝ ගොනෙකුට ... | 1 0 |

11–462—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

---

## කහවත්ත නගරය

**සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනත (477 වැනි අධිකාරය)**

### 1971 වර්ෂයට සුනඛයින් ලියාපදිංචිකිරීමේ ගාස්තු

477 අධිකාරය වන සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 4 වැනි වගන්තියේ ප්‍රකාර කහවත්ත නගරය තුළ තබා ගෙන සිටින සෑම පිරිමි සුනඛයෙකු සඳහා රුපියල් 1 බැගින්ද, ගැහැණු සුනඛයෙක් සඳහා රුපියල් 1.50 ක් බැගින්ද, 1971 මාර්තු 31 වැනිද හෝ ඊට ප්‍රථම ගෙවන අයුරින් ලියාපදිංචිකිරීමේ ගාස්තුවක් 1971 වර්ෂයට අය කිරීමට පනවා ඇති බව ප්‍රකාශයට පත්කරනු ලැබේ.

ඒ. ආර්. කරුණාරත්න,
විශේෂ කොමසාරිස්,
කහවත්ත නගරය.

1970 ඔක්තෝබර් මස 26 දින,
කහවත්ත නගරයේ
විශේෂ කොමසාරිස් කාර්යාලයේදිය.

11–461—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

---

## වාද්දුව උප නගර සභාව

**සුනඛ බද්ද**

### සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනත

වාද්දුව උප නගර සභා ප්‍රදේශය ඇතුළත ඇති කරන සෑම බල්ලෙකුටම රුපියල් 1 ක් සහ සෑම බැල්ලියකටම රු. 1.50 ක් ලියාපදිංචි බද්දක් 1971 වර්ෂය සඳහා අයකිරීමට සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (477 වන පරිච්ඡේදයේ) 4 වන වගන්තිය යටතේ වාද්දුව උප නගර සභාව විසින් පනවා ඇති බවත්, එම බද්ද 1971 මාර්තු 31 වැනි දිනට පෙර ගෙවිය හැකි බවත්, වාද්දුව උප නගර සභාව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඇම්. ඩී. ඒ. ගුණතිලක,
සභාපති,
වාද්දුව උප නගර සභාව.

1970 ඔක්තෝබර් මස 31 වැනි දින,
වාද්දුව උප නගර සභා කාර්යාලයේදීය.

11–466/1—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

---

## වාද්දුව උප නගර සභාව

**1971 වර්ෂය සඳහා රථවාහන හා සතුන් පිළිබඳ බද්ද**

(256 වෙනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ අංක 161 දරන වගන්තිය යටතේ පහත සඳහන් උපලේඛනයෙන් විස්තර වන ගණන් අනුව, 1971 වර්ෂයට රථවාහන හා සතුන් පිළිබඳ බද්දක් පනවා අය කිරීමටද,

2. එකී ආඥාපනතේ අංක 162 (3) වගන්තිය යටතේ එකී බදු 1971 මාර්තු 31 වෙනි දිනට හෝ ඊට පෙර ගෙවිය හැකි බවද, වාද්දුව උප නගර සභාව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

### උපලේඛනය

| | රු. ශ. |
|---|---|
| සෑම පාපැදියක්, රෝද තුනේ පාපැදියක් හෝ පාපැදි මෝටර් රථයක් හෝ කරත්තයක් හෝ රෝද තුනේ පාපැදි මෝටර් රථයක් හෝ කරත්තයක්— | |
| (අ) වෙළඳ කටයුතු පිණිස පාවිච්චි කෙරේ නම් (වා. න. වෙ. බ. අකුරු සහිත තහඩුව.)... | 5 0 |
| (ආ) වෙළඳ කටයුතු හැර වෙනත් කටයුතු සඳහා පාවිච්චි කෙරේ නම් (වා.න.බ. අකුරු සහිත තහඩුව) ... ... | 1 0 |
| සෑම අත්කරත්තයක් සඳහා (වා.න.අ.ක. අකුරු සහිත තහඩුව) ... ... | 1 0 |
| තනි ගොනා බැඳි සෑම බරබාගයක් හෝ තිරික්කලයක් වෙළඳ කටයුතු සඳහා පාවිච්චි කෙරේ නම් (වා.න.කු.ක. අකුරු සහිත තහඩුව) ... | 3 0 |
| තනි ගොනා බැඳි සෑම බරබාගයක් හෝ තිරික්කලයක් සඳහා (වා.න.බ.බා. අකුරු සහිත තහඩුව) ... | 2 0 |
| ගොන් දෙන්නා බැඳි සෑම බර කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා (වා.න.බ.ක. අකුරු සහිත තහඩුව.) ... ... | 4 0 |

ඇම්. ඩී. ඒ. ගුණතිලක,
සභාපති,
වාද්දුව උප නගර සභාව.

1970 ක්වූ ඔක්තෝබර් මස 31 වෙනි දින,
වාද්දුව උප නගර සභා කාර්යාලයේදීය.

11–466/2—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

---

## දළුගම සුළු නගර සභාව

**1971 වර්ෂයට දේපල බද්ද**

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතෙහි 159 වැනි වගන්තිය යටතේ මෙම ගතවී යන 1970 වර්ෂයට බලපවත්වන පහත සඳහන් දේපල බද්ද 1971 වර්ෂයටද එලෙසම පැනවීමට දළුගම සුළු නගර සභාව තීරණය කර ඇති බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

මෙම සුළු නගර සභා සීමාව තුළ පිහිටා තිබෙන (කුඹුරු හැර) සියළුම නිශ්චල දේපල වල වාර්ෂික වටිනාකමින් සියයට හතර බැගින් වූ දේපල බද්ද පිළිවෙළින් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 වෙනි දිනයන්හි සමාන කොටස් හතරකින් ගෙවා අවසන් කළ හැකිවේ.

කේ. ඇල්. විල්ප්‍රඩ් පෙරේරා,
සභාපති.
දළුගම සුළු නගර සභාව.

දළුගම සුළු නගර සභා කාර්යාලය,
මහර-කඩවත,
1970. 11. 3 වැනි දින.

11–451—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

## අම්බලන්තොට සුළු නගර සභාව

**1971 වර්ෂයේ සුනඛයින් ලියා පදිංචි කිරීමේ ගාස්තු**

### සුනඛයින් ලියා පදිංචි කිරීමේ ආඥාපනත (477 වැනි අධිකාරය)

(477 වැනි අධිකාරය වන) සුනඛයින් ලියා පදිංචි කිරීමේ ආඥාපනතේ 4 වැනි වගන්තියේ ප්‍රකාර, අම්බලන්තොට සුළු නගර සභා සීමාව තුළ තබාගෙන සිටින සෑම පිරිමි සුනඛයෙක් සඳහා රු. 1 බැගින් ද, ගැනු සුනඛයෙකු සඳහා රු. 1.50 බැගින් ද, 1971 මාර්තු 31 වැනිදා හෝ ඊට පෙර ගෙවන අයුරින් ලියා පදිංචි කිරීමේ ගාස්තුවක් 1971 වර්ෂයට අය කිරීමට පණවා ඇති බව තත් නගර සභාව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

කේ. සමරරත්න,
සභාපති,
අම්බලන්තොට සුළු නගර සභාව.

1970 නොවැම්බර් මස 1 වැනි දින,
අම්බලන්තොට සුළු නගර සභා කාර්යාලයේ දීය.

11–457/1—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

---

## අම්බලන්තොට සුළු නගර සභාව

**1971 වර්ෂයට රථවාහන සහ සතුන් පිළිබඳ බද්ද**

### සුළු නගර සභා ආඥාපනත (256 වැනි අධිකාරය)

අම්බලන්තොට සුළු නගර සභාව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලබන්නේ—

1. සුළු නගර සභා ආඥාපනතේ (256 වැනි අධිකාරය වන) අංක 161 දරණ වගන්තිය යටතේ පහත දැක්වෙන උපලේඛනයෙන් විස්තර වන ගණන් අනුව 1971 වර්ෂයට රථවාහන සහ සතුන් පිළිබඳ බද්ද පනවා අය කිරීමටද,

2. එකී ආඥාපනතේ 162 (3) වැනි වගන්තිය යටතේ එකී බදු 1971 මාර්තු 31 වැනි දිනට හෝ ඊට පෙර ගෙවිය හැකි අයුරෙන්ද වේ.

කේ. සමරරත්න,
සභාපති,
අම්බලන්තොට සුළු නගර සභාව.

1970 නොවැම්බර් මස 1 වැනි දින,
අම්බලන්තොට සුළු නගර සභා කාර්යාලයේ දීය.

**උපලේඛනය**

| | රු. | ශ. |
|---|---|---|
| මෝටර් කාර්, රෝදත්‍රයේ මෝටර් කාර්, මෝටර් ලොරි, මෝටර් පාපැදි, කරත්ත, අත්කරත්ත, ජින් රික්ෂෝ රථ, පාපැදි හෝ රෝදත්‍රයේ පාපැදි හැර වෙනයම් ඕනෑම වාහනයක් සඳහා ... ... | 5 | 0 |
| සෑම පාපැදි හෝ රෝදත්‍රයේ පාපැදියක් හෝ පාපැදි මෝටර් රථයක් හෝ කරත්තයක්— | | |
| (ඒ) වෙළඳාම සඳහා පාවිච්චි කෙරේ නම් ... | 5 | 0 |
| (බී) වෙළඳාමට හැර වෙනත් කටයුතු සඳහා පාවිච්චි කෙරේ නම් ... ... | 1 | 0 |
| ගොන් දෙන්නා බඳින සෑම කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... ... | 4 | 0 |
| තනි ගොනා බඳින සෑම බර බාගයක් හෝ තිරික්කලයක් සඳහා ... ... ... | 2 | 50 |
| සෑම අත් කරත්තයක් සඳහා ... ... | 1 | 0 |
| සෑම ජින් රික්ෂෝවක් සඳහා ... ... | 2 | 50 |
| සෑම අශ්වයෙක්, පෝනියෙක් හෝ කොටලුවෙක් සඳහා | 5 | 0 |
| සෑම බූරුවෙක් සඳහා ... ... | 1 | 0 |

11–457/2—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

---

## මාවතගම සුළු නගර සභාව

**ජලභීතිකා රෝගය**

මාවතගම සුළු නගර සභා සීමාව තුල ජලභීතිකා රෝග උවදුර පවතින බැවින් එම සභා සීමාව තුල පිහිටි පෞද්ගලික ගොඩනැගිල්ලක, ගෙමිදුලක හෝ ගෙවත්තක බැඳ නොතබන ලද්දාවූ හෝ දක්කාගෙන නොයනු ලබන්නා වූ කිසියම් සුනඛයෙකු (බල්ලෙකු හෝ බැල්ලියක) මා විසින් බලය පවරනු ලබන අයෙකු විසින් එවෙලෙහිම විනාශ කරනු ලබන බව (ලංකාවේ ව්‍යවස්ථාපිත ප්‍රඥප්ති සංග්‍රහයේ 476 වැනි පරිච්ඡේදය වන) ජලභීතිකා ආඥාපනතේ 11 වන වගන්තිය ප්‍රකාර මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

මෙම ප්‍රකාශනය 1970 නොවැම්බර් 1 වන දින සිට මාස හයක් වලංගු වන්නේ ය.

හේරත් බී. ඒකනායක,
මාවතගම සුළු නගර සභාවේ සභාපති.

1970 නොවැම්බර් මස 1 වන දින,
මාවතගම සුළු නගර සභා කාර්යාලය.

11–472—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

---

## ගික්කඩුව සුළු නගර සභාව

**සුළු නගර සභා ආඥාපනත (256 වැනි අධිකාරය)**

### 1971 වර්ෂයට වරිපණම් බද්ද

256 වැනි අධිකාරය වූ සුළු නගර සභා ආඥාපනත යටතේ, මෙම ගත වී යන අවුරුද්දට බලපවත්නා පහත සඳහන් ඒකාබද්ධ වරිපනම් බද්ද, 1971 වර්ෂයටද සුළු නගර සභා ප්‍රදේශය තුල එලෙසම පැනවීමට ගික්කඩුව සුළු නගර සභාව තීරණය කර ඇති බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලබන්නේ—

159 (1) වැනි වගන්තිය ප්‍රකාර, මෙම නගර සභා සීමාව තුළ පිහිටා තිබෙන සියළුම නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමින් සියයට නවය (9%) බැගින්වූ වාර්ෂික බද්ද පිළිවෙලින් ජූනි මස 30 වෙනිදයින් සහ දෙසැම්බර් මස 31 වැනිදයින් අවසන් වන අයුරු අර්ධ වාර්ෂිකව ගෙවිය හැකි අයුරිනි.

බී. ජේ. වීරසේකර,
ගික්කඩුව සුළු නගර සභාවේ සභාපති.

1970 ඔක්තෝබර් මස 31 වෙනි දින,
ගික්කඩුව සුළු නගර සභා කාර්යාලයේ දීය.

11–432/1—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

---

## ගික්කඩුව සුළු නගර සභාව

**1971 වර්ෂයේ සුනඛයින් ලියාපදිංචි කිරීමේ ගාස්තු**

### සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනත (477 වැනි අධිකාරය)

සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (477 වැනි අධිකාරය) 4 වැනි වගන්තිය ප්‍රකාර ගික්කඩුව සුළු නගර සභාවේ පාලන සීමාව තුල ඇතිකරනු ලබන සෑම බල්ලෙකු වෙනුවෙන් රු. 1 ක් ද, බැල්ලියක් වෙනුවෙන් රු. 1.50 ක් ද, 1971 මාර්තු මස 31 වෙනි දා හෝ ඊට පෙර ගෙවන අයුරින් ලියාපදිංචි කිරීමේ ගාස්තුවක්, 1971 වර්ෂයට අය කිරීමට පනවා ඇති බව තත් නගර සභාව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

බී. ජේ. වීරසේකර,
ගික්කඩුව සුළු නගර සභාවේ සභාපති.

1970 ඔක්තෝබර් මස 31 වෙනි දින,
ගික්කඩුව සුළු නගර සභා කාර්යාලයේ දීය.

11–432/2—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

## හික්කඩුව සුළු නගර සභාව

**1971 වර්ෂය සඳහා රථවාහන සහ සතුන් පිළිබඳ බද්ද**

256 වැනි අධිකාරය වන සුළු නගර සභා ආඥාපනත

හික්කඩුව සුළු නගර සභාව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලබන්නේ—

(1) 256 වැනි අධිකාරය වන සුළු නගර සභා ආඥාපනතේ අංක 161 දරණ වගන්තිය යටතේ පහත උපලේඛනයේ විස්තරවන ගණන් අනුව, 1971 අවුරුද්දට රථවාහන හා සතුන් සඳහා බද්දක් පනවා අයකිරීමටද,

(2) එකී ආඥාපනතේ 162 වගන්තිය යටතේ එකී බද්ද 1971 මාර්තු 31 වැනිදාට හෝ ඊට පෙර ගෙවිය හැකි අයුරින්ද වේ.

උපලේඛනය

| | රු. | ශ. |
|---|---|---|
| මෝටර් කාර්, රෝදත්‍රයේ මෝටර් කාර්, ලොරි, මෝටර් පාපැදි කරත්ත, අත් කරත්ත, රික්ෂෝ රථ, පාපැදි හෝ රෝදත්‍රයේ පාපැදි හැර වෙන ඕනෑම අන්දමේ වාහනයක් සඳහා ... ... ... | 5 | 0 |
| සෑම පාපැදියක් රෝදත්‍රයේ පාපැදියක් හෝ පාපැදි මෝටර් රථයක් හෝ කරත්තයක් හෝ රෝදත්‍රයේ පාපැදි මෝටර් රථයක් හෝ කරත්තයක්— | | |
| (අ) වෙළඳාම පිණිස පාවිච්චි කෙරේ නම් ... | 5 | 0 |
| (ආ) වෙළඳාම හැර වෙන කටයුතු සඳහා පාවිච්චි කෙරේ නම් ... ... | 1 | 0 |
| ගොන් දෙන්නා බැඳි සෑම බරකරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... ... | 4 | 0 |
| තනි ගොනා බැඳි සෑම බරබාගයක් හෝ තිරික්කලයක් සඳහා ... ... ... | 2 | 50 |
| සෑම අත්කරත්තයක් සඳහා ... ... | 2 | 50 |
| සෑම ජින් රික්ෂෝ රථයක් සඳහා ... ... | 2 | 50 |
| සෑම අශ්වයෙක්, පෝනියෙක් හෝ අශ්වතරයෙක් සඳහා ... | 5 | 0 |
| සෑම බූරුවෙක් සඳහා ... ... ... | 1 | 0 |

බී. ජේ. වීරසේකර,
හික්කඩුව සුළු නගර සභාවේ සභාපති.

1970 ඔක්තෝබර් මස 31 වෙනි දින,
හික්කඩුව සුළු නගර සභා කාර්යාලයේදිය.

11–432/3—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

---

## පල්ලෙවෙල ගම්සභාව—කොළඹ දිස්ත්‍රික්කය

**මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත**

මෙහි පහත විස්තර දක්වෙන උප ලේඛනයෙහි සඳහන් අය විසින් මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා 1971 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම් කොට ඇති බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධ වන පල්ලෙවෙල ගම්සභා ප්‍රදේශය තුළ පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ විරුද්ධ වන්නේ අසවල් කරුණු නිසා යයි දක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකක් සහිතව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවී දින දහහතරක් (14) ඇතුළත මා වෙත ලියා එවීමට බලය ඇති බවත් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 201 වැනි පරිච්ඡේදයේ අංක 7 දරණ සහ 1947 අංක 44 දරණ ආඥාපනතේ සංශෝධිත අංක 6 දරණ ආඥාපනත අනුව මෙයින් දැනුම් දෙමි.

උප ලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය | බලපත්‍රයේ ස්වභාවය |
|---|---|---|
| ඒ. ඇල්. ඇම්. මව්ජුඩ් 25, මල්වත්ත පාර, කොළඹ 11 ... | ... හල්කළිය | ... එළ හරක් මස් |

පල්ලෙවෙල ගම්සභා කාර්යාලය,
බාදුරාගොඩ, 1970 නොවැම්බර් මස 1 වැනි දින.

ජී. ආර්. හරමානිස්,
පල්ලෙවෙල ගම්සභාවේ සභාපති.

11–445—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

---

## කොළඹ දිස්ත්‍රික්කයේ තලාහේන ගම්සභාව

**මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත**

මෙහි පහත විස්තර දක්වෙන උප ලේඛනයේ සඳහන් අය විසින් 1971 වර්ෂයට මස්කඩ පවත්වාගෙන යාමට බල පත්‍ර ඉල්ලුම්කර සිටින බවත්, ඒ අනුව බල පත්‍ර නිකුත් කිරීමට තලාහේන ගම් ප්‍රදේශය තුල පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් එසේ විරුද්ධවීමට හේතු සඳහන්කර පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුලත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 අධිකාරය) 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

ගම්සභා කාර්යාලය,
තලාහේන, මීගමුව,
1970 නොවැම්බර් 4 වෙනි දිනදීය.

ඇස්. පිලිප් රෝසා,
සභාපති,
තලාහේන ගම්සභාව.

උප ලේඛනය

| | ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය | වෙළඳාමේ ස්වභාවය |
|---|---|---|---|
| 1. | ඇල්. පී. සී. ප්‍රනාන්දු, උතුරුපිටිපන, මීගමුව ... | ... කැපුන්ගොඩ අංක 1 මස්කඩය | ... හරක් මස් |
| 2. | ඇල්. පී. සී. ප්‍රනාන්දු, උතුරු පිටිපන, මීගමුව ... | ... පිටිපන ලෙල්ලමලග මස් කඩය | ... හරක් මස් |
| 3. | ඇල්. පී. සී. ප්‍රනාන්දු, උතුරු පිටිපන, මීගමුව ... | ... උතුරු පිටිපන මස් කඩය | ... හරක් මස් |
| 4. | ඇල්. තෝමස් සිල්වා, 466, උතුරුපිටිපන, මීගමුව ... | ... පිටිපන වීදිය මස්කඩය | ... හරක් මස් |

11–437—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

---

## පැල්මඩුල්ල සුළු නගර සභාව

**1971 වර්ෂයට සුනඛ බදු**

සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනත (477 වැනි අධිකාරය)

(477 වැනි අධිකාරය වන) සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 4 වෙනි වගන්තියේ ප්‍රකාර පැල්මඩුල්ල සුළු නගර සභා බල මණ්ඩලය තුල තබාගෙන සිටින සෑම බල්ලෙක් සඳහා රු. 1 බැගින්ද, සෑම බැල්ලියක් සඳහා රු. 1.50 බැගින්ද, 1971 මාර්තු මස 31 වෙනි දිනට හෝ එදිනට පෙර ගෙවන අයුරින් ලියා පදිංචි කිරීමේ ගාස්තුවක් 1971 වර්ෂයට අයකිරීමට පණවා ඇති බව පැල්මඩුල්ල සුළු නගර සභාව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එච්. ඇල්. මරික්කාර්,
පැල්මඩුල්ල සුළු නගර සභාවේ සභාපති.

1970 නොවැම්බර් මස 1 වෙනි දින,
පැල්මඩුල්ල සුළු නගර සභා කාර්යාලයේදීය.

11–464/1—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

## පැල්මඩුල්ල සුළු නගර සභාව

### 1971 අවුරුද්ද සඳහා සතුන් පිළිබඳ බද්ද

### 256 වන අධිකාරය වන සුළු නගර සභා ආඥාපනත

පැල්මඩුල්ල සුළු නගර සභාව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලබන්නේ—

(1) සුළු නගර සභා ආඥාපනතේ (256 වෙනි අධිකාරය) අංක 161 දරණ වගන්තිය යටතේ පහත දැක්වෙන උපලේඛන යෙන් විස්තර වන ගණන් අනුව 1971 වර්ෂයට රථ වාහන සහ සතුන් පිළිබඳ බද්දක් පනවා අයකිරීමටද,

(2) එකී ආඥාපනතේ අංක 162 (3) දරණ වගන්තිය යටතේ එකී බදු 1971 මාර්තු 31 වෙනි දින හෝ ඊට ප්‍රථම ගෙවිය හැකි අයුරින්ද වේ.

එච්. ඇල්. මරික්කාර්,
සභාපති.

1970 නොවැම්බර් මස 1 වෙනි දින,
පැල්මඩුල්ල සුළු නගර සභා කාර්යාලයේදීය.

### උපලේඛනය

| | රු. | ශ. |
|---|---|---|
| මෝටර් කාර්, මෝටර් රෝදත්‍රයේ කාර්, මෝටර් ලොරි, මෝටර් පාපැදි, කරත්ත, අත්කරත්ත, ජින්රික්ෂෝ රථ, පාපැදි හෝ රෝදත්‍රයේ පාපැදි හැර වෙනයම් ඕනෑම වාහනයක් සඳහා ... ... | 5 | 0 |
| සෑම පාපැදියකට හෝ රෝද තුනේ පාපැදියකට හෝ පාපැදි කාරයකට හෝ කරත්තයකට හෝ රෝද තුනේ පාපැදි කාරයකට හෝ කරත්තයකට— | | |
| (අ) වෙළඳ කාර්යයන් සඳහා පාවිච්චි කිරීම ... | 3 | 0 |
| (ආ) වෙළඳ කාර්යයන් හැර වෙන ඕනෑම කාර්යයක් සඳහා පාවිච්චි කෙරේ නම් ... | 1 | 0 |
| සෑම ගොන් බඳින කරත්තයක් සඳහා ... | 4 | 0 |
| සෑම අත්කරත්තයක් සඳහා ... ... | 2 | 0 |
| සෑම ජින්රික්ෂෝ රථයක් සඳහා ... | 2 | 50 |
| සෑම අශ්වයෙක්, පෝනියෙක් හෝ කොටළුවකුට ... | 5 | 0 |
| සෑම ගොනෙක් හෝ බූරුවෙක් සඳහා ... | 1 | 0 |

11–464/2—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

---

## ගලහිටියාව ගම්සභාව

මෙහි පහත උපලේඛනයේ දක්වෙන අය විසින් 1971 වර්ෂයට මස් පිණිස සතුන් මැරීමට හා මස්කඩ පවත්වාගෙන යාමට බලපත්‍ර ඉල්ලුම්කර සිටින බවත් ඒ අනුව බලපත්‍ර නිකුත්කිරීම ගැන ගලහිටියාව ගම්සභා සීමාව තුල පදිංචි යම්කෙනෙක් විරුද්ධවන්නේ නම් එසේ විරුද්ධවීමට හේතු දක්වා පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක් මෙම දන්වීම ගැසට් පත්‍රයේ පලකිරීමේ දින සිට දින 14 ක් ඇතුලතදී මාවෙත ලියාඑවීමට බලය තිබෙන බවත් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 272 වැනි පරිච්ඡේදයේ 7 වැනි වගන්තිය යටතේ මෙයින් දනුම්දෙමි.

### උපලේඛනය

| | ඉල්ලුම්කරුගේ නම | වෙළඳම | පිහිටි ස්ථානය |
|---|---|---|---|
| 1. | ජේ. ඒ. දෙන් විල්ප්‍රඩ් මහතා ... ... ... | එළහරක් මස් ... | ගලහිටියාව නගරය |
| 2. | එච්. ඩී. සී. අප්පුහාමි මහතා ... ... ... | එළහරක් මස් ... | ගම්පහ පහලගම |

ගම්සභා කාර්යාලය,
ගලහිටියාව, ගණේමුල්ල.
1970 නොවැම්බර් 2.

එච්. ඩී. ගිල්බට්,
ගලහිටියාව ගම්සභාවේ සභාපති.

11–448—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

---

## හමංගල්ල ගම්සභාව

### මස් පිණිස සතුන් මැරීම පිළිබඳ ආඥාපනත

මෙහි පහත දක්වෙන උපලේඛනයේ නම් සඳහන් අයවළුන් විසින් මෙහි පහත දක්වෙන ස්ථානවල 1971 වර්ෂයට මස් කඩ පවත්වාගෙන යාම සඳහා බල පත්‍ර ඉල්ලුම්කර ඇති බවත් මෙම බල පත්‍ර නිකුත් කිරීම ගැන හමංගල්ල ගම්සභා ප්‍රදේශය තුල පදිංචි ඕනෑම කෙනෙකුගේ විරුද්ධත්වයක් ඇත්නම් එය විස්තර සහිතව පිටපත් දෙකකින් යුත් ලියවිල්ලකින් සකස් කොට, මෙම දන්වීම ගැසට් පත්‍රයේ පලවන දින සිට දින 14 ක් ඇතුලත මා වෙත ලැබෙන්නට සැලැස්විය යුතු බැව්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වැනි අධිකාරය) 7 වැනි වගන්තියේ ප්‍රකාර මෙයින් දනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

| | ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාමේ ස්වභාවය | ස්ථානය |
|---|---|---|---|
| 1. | අයි. ඇල්. ඇම්. ෂෙරිෆ්, ගිරිඋල්ල ... ... ... | හරක් මස් ... | ගිරිඋල්ල පොදු වෙළඳ සැල |
| 2. | අයි. ඇල්. ඇම්. ෂෙරිෆ්, ගිරිඋල්ල ... ... ... | එළු මස් ... | එම |
| 3. | ඒ. ආර්. ඇම්. මුෂින්, මුම්මාන, දඹදෙනිය ... ... ... | හරක් මස් ... | එම |
| 4. | ඒ. ඇම්. කාසිම්, මුම්මාන, දඹදෙනිය ... ... ... | හරක් මස් ... | හිඟුරවත්ත, මුම්මාන |

1970 නොවැම්බර් මස 2 වෙනි දින,
හමංගල්ල ගම්සභා කාර්යාලයේදීය.

ලීලානන්ද වීරසිංහ,
සභාපති හමංගල්ල ගම්සභාව

11–450—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

---

## පැල්මඩුල්ල සුළු නගර සභාව

### 1971 වර්ෂයට දේපොල බද්ද

සුළු නගර සභා ආඥාපනත (256 වැනි අධිකාරය) යටතේ ගතවී යන 1970 වර්ෂයට බලපවත්නා පහත සඳහන් දේපොල බදු 1971 වර්ෂයටද එලෙසම පැනවීමට පැල්මඩුල්ල සුළු නගර සභාව තීරණය කර ඇති බව මෙයින් ප්‍රකාශයට පත්කරනු ලැබේ.

එකී ආඥාපනතේ 159 (1) වැනි වගන්තිය ප්‍රකාර මෙම සුළු නගර සභා සීමාව තුළ පිහිටා තිබෙන සියළුම නිශ්චල දේපොලවල (කුඹුරු හැර) වාර්ෂික වටිනාකමින් සියයට හය බැගින් වාර්ෂික බදු පිළිවෙලින් මාර්තු 31 වැනිදයින්, ජූනි 30 වැනිදයින්, සැප්තැම්බර් 30 වැනිදායින් හා දෙසැම්බර් 31 වැනිද.යින් අවසන් වන අයුරින් කාර්තු වශයෙන් ගෙවිය හැකිවේ.

එච්. ඇල්. මරික්කාර්,
පැල්මඩුල්ල සුළු නගර සභාවේ සභාපති.

1970 නොවැම්බර් 1 වැනි දින,
පැල්මඩුල්ල සුළු නගර සභා කාර්යාලයේදීය.

11–465—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

## කොළඹ දිස්ත්‍රික්කයේ ගලහිටියාව ගම්සභාව

### ගලහිටියාව, මාකේවිට, අකරවිට, කිරිඳිවිට, ඉහලගම දියුණු ගම්ප්‍රදේශ හැටියට ප්‍රකාශයට පත්කිරීම

පහත දක්වෙන උපලේඛනයේ සඳහන් මායිම්වලට සීමාවූ කොළඹ දිස්ත්‍රික්කයේ ගලහිටියාව ගම්ප්‍රදේශයේ ගලහිටියාව, මාකේවිට, ඉහලගම, අකරවිට සහ කිරිඳිවිට දියුණු ගම්ප්‍රදේශ වශයෙන් 257 වැනි අධිකාරය වන ගම්සභා ආඥාපනතේ 37 (අ) වගන්තිය යටතේ කොළඹ දිස්ත්‍රික්කයේ සහකාර පළාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතිය ඇතිව ප්‍රකාශයට පමුණුවා ඇති බැව් මහජනයාගේ දැනගැනීම සඳහා මෙයින් දැනුම් දෙනු ලැබේ.

**ගලහිටියාව දියුණු ප්‍රදේශය :**

ගණේමුල්ල කඩවත පාරේ සැතපුම් 1/2 කණුව තෙක් පාරේ මැද සිට දකුණු දිසාවට අඩි 300 ක බිම් තීරුවද, කඳාන ගණේමුල්ල පාරේ බොල්ලත ගම්සීමාව දක්වාද, ගණේමුල්ල කිරිඳිවිට පාරේ සැතපුම් 1 කණුව තෙක්ද, හොරගොල්ල මාවිලන්ගමුව පාරේ හොරගොල්ල ශ්‍රී ලංකා විද්‍යාලය දක්වාද, ගලහිටියාව ජාඇල පාරේ ජාඇලට හැරෙන මංසන්ධියේ සිට තිබ්බොටුගොඩ කීර්ති පාරේ මංසන්ධිය දක්වාද, ගලහිටියාව ගම්බද උසාවි පාරේ සිට කඳාන ගණේමුල්ල පාර දක්වාද, හොරගොල්ල පෙරේරා මාවත පටන් ගැන්මේ සිට කිරිඳිවිට ගණේමුල්ල පාරේ මංසන්ධිය දක්වා ද වූ පාරවල්වල මැද සිට දෙපසට අඩි 300 ක බිම් තීරුවද ;

**කිරිඳිවිට දියුණු ප්‍රදේශය :**

ගම්පහ ජාඇල පාරේ අඹන්විට ගම්සීමාවේ සිට පහලගම එච්. ඒ. අර්නස් මහතාගේ නිවස අසල වාරිමාර්ග ඇල දක්වා පාරේ මැද සිට දෙපසට අඩි 300 ක බිම් තීරුද ;

**අකරවිට දියුණු ප්‍රදේශය :**

අකරවිට ගම්බද උසාවි පාරේ පටන්ගැන්මේ සිට අවසානය තෙක්ද, අකරවිට පන්සල පාරේ පටන් ගැන්මේ සිට අවසානය තෙක්ද පාරේ මැද සිට දෙපසට අඩි 300 ක බිම් තීරුද ;

**මාකේවිට දියුණු ප්‍රදේශය :**

ගම්පහ ජාඇල පාරේ මාකේවිට අම්බලම ලඟ සිට මාබිම පිරිවෙන පාරේ මංසන්ධිය දක්වා පාරේ මැද සිට දෙපසට අඩි 300 ක බිම් තීරුද ;

**ඉහලගම දියුණු ප්‍රදේශය :**

ඉහලගම ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවට අයත් ගම්පහ ඉහලගම පාරේ පටන්ගැන්මේ සිට ගම්පහ අළුත්ගම මායිම දක්වාද, ගම්පහ ඉහලගම පුරාණ විහාරස්ථානයට යන පාරේ පටන්ගැන්මේ සිට අවසානය තෙක්ද, බණ්ඩාරවත්ත පාසැල් මාවතේ පටන්ගැන්මේ සිට ගම්පහ අළුත්ගම කඩඉම දක්වාද, ඉහලගම මංකඩ පාරේ මංකඩ පාලම දක්වා පාරේ නැගෙනහිර කොටසද, බටලන්ද වලව්වත්ත සම්බන්ධතා පාර පටන් ගැන්මේ සිට අවසානය තෙක්ද වූ පාරවල් වල මැද සිට දෙපසට අඩි 300 ක බිම් තීරුද විය යුතුයි.

එච්. ඩී. ගිල්බට්,
ගලහිටියාව ගම්සභාවේ සභාපති.

70. 10. 26,
ගම්සභා කාර්යාලය,
ගලහිටියාව,
ගණේමුල්ල.

11–469—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

---

## 1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන "පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා" පණත (261 වන අධිකාරය)

පළාත් පාලන ආයතන "පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා" පනතේ 3 වන වගන්තිය යටතේ කළුතර දිස්ත්‍රික්කයේ කුඹුකේ පත්තු ගම්සභාව විසින් සම්මත කරගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තිය ප්‍රකාර මෙයින් පළකර සිටිනු ලැබේ.

**යෝජනාව**

පළාත් පාලන ඇමතිතුමා විසින් සම්මත කරනු ලැබ, 1953 අප්‍රේල් මස 10 වන දින අංක 10,517 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද්දවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1953 අගෝස්තු මස 7 වන දින අංක 10,560 දරණ ගැසට් පත්‍රයේ පලවූ නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරන ලද්දවූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල අංක 1-37 දක්වා වූ කාණ්ඩ ද, වර්ෂ 1963 ජූනි මස 21 වන දින අංක 13,679 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරන ලද්දවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරනු ලැබ 1965 ජනවාරි මස 8 වන දින අංක 14,287 දරණ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පමුණුවනු ලැබුවාවූද එකී අතුරු ව්‍යවස්ථා මාලාවේ අංක 38 දරණ කාණ්ඩයද, වර්ෂ 1966 ක්වූ ජූලි මස 8 වන දින අංක 14,703 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරනු ලැබ 1969 ජනවාරි මස 3 වන දින අංක 14,835 දරණ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පමුණුවනු ලැබුවාවූද එකී අතුරු ව්‍යවස්ථා මාලාවේ 39, 40 සහ 41 වන කාණ්ඩද මෙම යෝජනාව ගැසට් පත්‍රයේ පළවූ දින සිට ක්‍රියාත්මක වන අන්දමින් සම්මත කර ගැනීමට කළුතර දිස්ත්‍රික්කයේ කුඹුකේ පත්තු ගම්සභාව විසින් පළාත් පාලන ආයතන "පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා" පණතේ "261 වන අධිකාරය 3 වන වගන්තියේ" (1) වන උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ.

ජී. ඇම්. පෙරේරා,
කුඹුකේ පත්තු ගම්සභාවේ සභාපති.

1970 ඔක්තෝම්බර් මස 24 දින,
කනන්විල,
ගම්සභා කාර්‍යාලයේ දී.

11–467—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

---

## දෙහිඕවිට සුළු නගර සභාව

### 1971 වර්ෂය සඳහා දේපල වරිපනම් බද්ද

සුළු නගර සභා ආඥාපනත (256 වැනි අධිකාරය) යටතේ මෙම ලබන්නා වූ යන අවුරුද්දට බලපවත්වන පහත සඳහන් වරිපනම් බදු 1971 වර්ෂයටද, එලෙසම පැනවීමට දෙහිඕවිට සුළු නගර සභාව තීරණය කර ඇති බව තත් සුළු නගර සභාව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

159 වැනි වගන්ති ප්‍රකාර මෙම නගර සභා සීමාව තුළ පිහිටා තිබෙන කුඹුරු හැර සියලුම නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමින් සියයට හය බැගින් වාර්ෂික බදු පිළිවෙලින් මාර්තු 31 වැනිදායින්, ජූනි 30 වැනිදායින්, සැප්තැම්බර් 30 වෙනිදායින් හා දෙසැම්බර් 31 වැනිදායින් අවසන් වන අයුරින් කාර්තු වශයෙන් ගෙවිය හැකිවේ.

මො. ලෙ. අ. ජාපීර්,
සභාපති,
දෙහිඕවිට සුළු නගර සභාව.

1970 නොවැම්බර් මස 3 වෙනි දින,
දෙහිඕවිට සුළු නගර සභා කාර්‍යාලයේදීය.

11–431/1—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

---

## දෙහිඕවිට සුළු නගර සභාව

### 1971 වර්ෂය සඳහා වූ බයිසිකල් ගාස්තු

256 වෙනි අධිකාරය වන සුළු නගර සභා ආඥාපනතේ 152 හා 156 වෙනි වගන්ති යටතේ දෙහිඕවිට සුළු නගර සභා සීමාව තුළ බයිසිකල් ශෝධනය කෙරෙන සෑම බයිසිකල් බාල්දියක් සඳහා වියදම මසකට රුපියල් 1.00 ක ගාස්තුවක් අය කිරීමටද, එම ගාස්තු 1970 වර්ෂයේ බලපැවැත්වෙන ගාස්තුවලට සමාන බැව්ද, දෙහිඕවිට සුළු නගර සභාව තීරණය කර ඇති බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

මො. ලෙ. අ. ජාපීර්,
සභාපති,
දෙහිඕවිට සුළු නගර සභාව.

1970 නොවැම්බර් මස 3 වෙනි දින,
දෙහිඕවිට සුළු නගර සභා කාර්‍යාලයේදීය.

11–431/2—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

## දෙහිඹිවිට සුළු නගර සභාව

**1971 වර්ෂය සඳහා රථවාහන හා සතුන් පිළිබඳ බද්ද**

256 වෙනි අධිකාරය වන සුළු නගර සභා ආඥාපනත

දෙහිඹිවිට සුළු නගර සභාව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලබන්නේ :—

(1) සුළු නගර සභා ආඥාපනතේ (256 වන අධිකාරය) 161 (1) වැනි වගන්තිය යටතේ පහත සඳහන් උපලේඛනයේ එම වාහන හා සතුන් ඉදිරියේ සඳහන් කර තිබෙන ගණන් අනුව රථවාහන හා සතුන් පිළිබඳ බද්දක් 1971 වර්ෂයට පනවා ඇති බව, හා

(2) යථෝක්ත ආඥාපනතේ 162 (3) වැනි වගන්තිය යටතේ එකී බදු 1971 මාර්තු මස 31 වැනිදා හෝ ඊට පෙර ගෙවිය යුතු බවත් ය.

**උපලේඛනය**

| | රු. | ශත |
|---|---|---|
| සෑම පාපැදියක්, රෝදත්‍රයේ පාපැදියක් හෝ පාපැදි මෝටර් රථයක් හෝ කරත්තයක් හෝ රෝදත්‍රයේ පාපැදි මෝටර් රථයක් හෝ කරත්තයක් සඳහා... | 1 | 0 |
| ඕනෑම අන් දමක ගොන් දෙන්නා බැඳි සෑම කරත්තයක් සඳහා ... ... | 3 | 0 |
| තනි ගොනා බැඳි සෑම බරබාගයක් හෝ තිරික් කලයක් සඳහා ... ... | 2 | 50 |
| සෑම අන් කරත්තයක් සඳහා ... ... | 1 | 0 |
| සෑම රික්ෂෝ රථයක් සඳහා ... ... | 3 | 0 |

මො. ලෙ. අ. ජාපිර්,
සභාපති,
දෙහිඹිවිට සුළු නගර සභාව.

1970 නොවැම්බර් මස 3 වෙනි දින,
දෙහිඹිවිට සුළු නගර සභා කාර්යාලයේ දීය.

11–431/3—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

---

## 1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා ආඥාපනත

1952 අංක 6 දරණ ප්‍රදේශකාරි සභා පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා ආඥාපනතේ 3 වෙනි වගන්තිය යටතේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ තිස්පනේ ගම්සභා ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කරගන්නා ලද පහත දැක්වෙන යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙහි පලකරනු ලැබේ.

**යෝජනාව**

ගරු පළාත් පාලන ඇමතිවරයා විසින් සම්පාදනය කරනු ලැබ 1966 ජූලි මස 8 වැනි දින අංක 14,703 දරණ ගැසට් පත්‍රයේ පලකරන ලද්දාවූද උත්තර මන්ත්‍රී මණ්ඩලයේ සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරනලද බව 1969 ජනවාරි මස 3 වැනි දින අංක 14,835 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල අංක 39, 40 සහ 41 වැනි කාණ්ඩ මෙම යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට සම්මත කරගැනීමට නුවරඑළිය දිස්ත්‍රික්කයේ තිස්පනේ ගම්සභාව විසින් පළාත් පාලන ආයතන පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා පනතේ 261 වැනි අධිකාරය 3 වැනි වගන්තියේ 1 වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනාකර සිටිනු ලැබේ.

යූ. බී. ජයසුන්දර,
තිස්පනේ ගම්සභාවේ සභාපති.

1970 ඔක්තෝබර් මස 11 වැනි දින,
වටද්දර, තිස්පනේ ගම්සභා කාර්යාලයේ දීය.

11–434—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

---

## කොළඹ දිස්ත්‍රික්කයේ නාරන්වල ප්‍රදේශයේ ගම්සභාව

**මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත**

මෙහි පහත උපලේඛනයෙහි නම සඳහන් අය එහි සඳහන් ස්ථානයන්හි 1971 වර්ෂයට මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා අවසර පත්‍ර ඉල්වා අයදුම් පතක් මා වෙත එවා තිබෙන බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණතේ 272 වැනි පරිච්ඡේදයේ 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එම බලපත්‍ර නිකුත් කිරීම ගැන කොළඹ දිස්ත්‍රික්කයේ නාරන්වල ගම්ප්‍රදේශයේ ගම්සභා සීමාව තුල පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇය එසේ විරුද්ධ වන්නේ කුමන කරුණු නිසාද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකක් සිටිනසේ මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළ වූ දින සිට දහ හතර (14) දිනක් ඇතුළත මා වෙත එවිය යුතු බව මෙයින් දන්වමි.

**උපලේඛනය**

| ඉල්ලුම්කරුගේ නම | මෙළදාම පවත්වන ස්ථානය |
|---|---|
| 1. ඇම්. සී. ඇම්. ආරිෆ්, වල්ගම, මල්වාන | දෙල්ගොඩ පොදු වෙළඳපොල ගොඩනැගිල්ලේ අංක 7 දරණ කඩ කාමරය. |
| 2. ඇම්. සී. ඇම්. ආරිෆ් වල්ගම, මල්වාන | වල්ගම–මල්වාන නගරයේ පිහිටි ඊෆායා ගොඩනැගිල්ලේ අංක 5, 6 සහ 7 දරණ කඩ කාමර. |
| 3. ඇම්. සී. ඇම්. ආරිෆ් වල්ගම, මල්වාන | වල්ගම පිහිටි මිල්ලගහවත්ත නමැති ඉඩමේ සතුන් මරණ ස්ථානය. |

එස්. කේ. සූරිආරච්චි,
නාරන්වල ගම්සභාවේ සභාපති තැන.

1970 නොවැම්බර් 4,
නාරන්වල ගම්සභාව,
දෙල්ගොඩ.

11–441—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

---

## පානම ගම්සභාව

**ජලභීතිකා රෝගය**

අම්පාර දිස්ත්‍රික්කයේ පානම පත්තුවේ පානම ගම්සභා සීමාව තුළ ජලභීතිකා රෝග උවදුර පවතින බැවින්, එම ගම්සභා සීමාව තුළ පිහිටි පෞද්ගලික ගොඩනැගිල්ලක, ගෙමිදුලක හෝ ගෙවත්තක නොවන්නාවූ අන්‍ය ස්ථානයක හෝ පාරක හමුවන දඩාවතේ යන නැතහොත් බැඳ නොතබන ලද්දාවූ හෝ දක්කාගෙන නොයනු ලබන්නාවූ කිසියම් සුනඛයෙකු (බල්ලෙකු හෝ බැල්ලියක) ම විසින් ලියවිල්ලකින් බලය පවරනු ලබන අයෙකු විසින් එවේලෙහිම විනාශ කරනු ලබන බව (476 වෙනි අධිකාරය වන) ජලභීතිකා ආඥාපනතේ 11 වෙනි වගන්තියේ ප්‍රකාර මෙයින් දැනුම් දෙමි.

මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළවන දින සිට හය මාසයක් ගතවනතුරු වලංගු වන්නේ ය.

එම්. ඒ. සෙනවිරත්න,
සභාපති.

1970 ක්වූ ඔක්තෝබර් මස 20 වැනි දින,
පානම ගම්සභා කායසීාලය,
පොතුවිල්. 3.

11–440—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

---

## කොලොන්නාව පළාත් ආණ්ඩු සභාව

**1971 වර්ෂය සඳහා රථවාහන සහ සතුන් පිළිබඳ බද්ද**

පළාත් ආණ්ඩු සභා ආඥාපනත (255 වෙනි අධිකාරය)

පළාත් ආණ්ඩු සභා ආඥාපනතේ (255 වෙනි අධිකාරය) 163 (3) වගන්තිය අනුව 1970 වර්ෂයේ පනවා ඇති බදුම, 1971 වර්ෂයට ද එලෙසම පනවා පහත සඳහන් උපලේඛනයේ දැක්වෙන පරිදි අය කරන බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

2. පළාත් ආණ්ඩු සභා ආඥාපනතේ (255 වෙනි අධිකාරය) 163 (3) වගන්තිය යටතේ මෙම බදු 1971 මාර්තු 31 වෙනි දිනට හෝ ඊට ප්‍රථම කොලොන්නාව පළාත් ආණ්ඩු සභා කාර්යාලයට ගෙවිය යුතු බව ද මෙයින් දැනුම් දෙනු ලැබේ.

ගලගෙදරගේ සෝමසිරි,
සභාපති,
කොලොන්නාව නගර සභාව.

1970 නොවැම්බර් මස 2 වෙනි දින,
කොලොන්නාව නගර සභා කාර්යාලය,
වැල්ලම්පිටිය.

### උපලේඛනය

| | රු. | ශ. |
|---|---|---|
| මෝටර් රථය, රෝද තුනේ මෝටර් රථය, මෝටර් ලොරි, මෝටර් බයිසිකල්, කරත්ත, අත් කරත්ත, ජින්රික්ෂෝ, බයිසිකල් හැර ඕනෑම අන් දමේ වාහනයකට ... ... | 5 | 0 |
| ඕනෑම බයිසිකලයකට හෝ රෝද තුනේ බයිසිකලයකට හෝ බයිසිකල් රථයකට ... ... | 3 | 0 |
| වෙළඳාම පිණිස පාවිච්චි කරනු ලබන්නේ නැති ඒවාට ... ... | 1 | 0 |
| ගොන් දෙන්නා බැඳි සෑම කරත්තයකට හෝ තිරික්කලයකට ... ... | 3 | 0 |
| තනි ගොනා බැඳි සෑම කරත්තයකට හෝ තිරික්කලයකට ... ... | 2 | 0 |
| සෑම අත් කරත්තයකට ... ... | 2 | 0 |
| සෑම ජින් රික්ෂෝවකටම ... ... | 2 | 0 |
| සෑම අශ්වයකුට හෝ පෝනියකුට හෝ කොටළුවකුට ... | 2 | 0 |
| සෑම ගොනෙකුට හෝ බූරුවකුට ... | 1 | 0 |

11–429/1—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

---

## කොලොන්නාව පළාත් ආණ්ඩු සභාව

### 1971 වර්ෂයේ සුනඛ බද්ද—සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනත (477 වෙනි අධිකාරය)

සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (477 වෙනි අධිකාරය) 4 වෙනි ඡේදය අනුව කොලොන්නාව පළාත් ආණ්ඩු සභා සීමාව තුළ සිටින සෑම බල්ලෙකුට හෝ බැල්ලියකට ලියාපදිංචි කිරීමේ ගාස්තුව වශයෙන් රු. 1.50 ක් අය කිරීමට පනවා ඇති බව ද එම ලියාපදිංචි කිරීමේ ගාස්තුව 1971 මාර්තු මස 31 වෙනි දින හෝ ඊට ප්‍රථම කොලොන්නාව පළාත් ආණ්ඩු සභා කාර්යාලයට ගෙවිය යුතු බව ද මෙයින් දැනුම් දෙනු ලැබේ.

ගලගෙදරගේ සෝමසිරි,
සභාපති,
කොලොන්නාව නගර සභාව.

1970 නොවැම්බර් මස 2 වෙනි දින,
කොලොන්නාව නගර සභා කාර්යාලය,
වැල්ලම්පිටිය.

11–429/2—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

**සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.**

**ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතු වන බව සලකන්න.**

**ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්‍යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්‍යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුයි.**

### උපලේඛනය

**1970**

| මාසය | පළ කිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|
| ජූනි | 70. 6. 5 සිකුරාද | 70. 5.29 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 6.11 බ්‍රහස්පතින්ද | 70. 6. 5 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 6.18 බ්‍රහස්පතින්ද | 70. 6.11 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70. 6.25 බ්‍රහස්පතින්ද | 70. 6.18 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| ජූලි | 70. 7. 2 බ්‍රහස්පතින්ද | 70. 6.25 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70. 7.10 සිකුරාද | 70. 7. 2 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70. 7.17 සිකුරාද | 70. 7.10 සිකුරාද | දහවල් | 12.0 |
| | 70. 7.24 සිකුරාද | 70. 7.17 සිකුරාද | දහවල් | 12.0 |
| | 70. 7.31 සිකුරාද | 70. 7.24 සිකුරාද | දහවල් | 12.0 |
| අගෝස්තු | 70. 8. 7 සිකුරාද | 70. 7.30 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70. 8.14 සිකුරාද | 70. 8. 7 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 8.21 සිකුරාද | 70. 8.14 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 8.28 සිකුරාද | 70. 8.21 සිකුරාද | ප.ව. | 3.30 |
| සැප්තැම්බර් | 70. 9. 4 සිකුරාද | 70. 8.28 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.11 සිකුරාද | 70. 9. 4 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.18 සිකුරාද | 70. 9.11 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.25 සිකුරාද | 70. 9.18 සිකුරාද | ප.ව. | 3.30 |
| ඔක්තෝබර් | 70.10. 2 සිකුරාද | 70. 9.25 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10. 9 සිකුරාද | 70.10. 2 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.16 සිකුරාද | 70.10. 9 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.23 සිකුරාද | 70.10.16 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.30 සිකුරාද | 70.10.23 සිකුරාද | ප.ව. | 3.30 |
| නොවැම්බර් | 70.11. 5 බ්‍රහස්පතින්ද | 70.10.30 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.11.12 බ්‍රහස්පතින්ද | 70.11. 5 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70.11.20 සිකුරාද | 70.11.12 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70.11.27 සිකුරාද | 70.11.20 සිකුරාද | දහවල් | 12.0 |
| දෙසැම්බර් | 70.12. 4 සිකුරාද | 70.11.27 සිකුරාද | දහවල් | 12.0 |
| | 70.12.11 සිකුරාද | 70.12. 4 සිකුරාද | දහවල් | 12.0 |
| | 70.12.18 සිකුරාද | 70.12.10 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70.12.24 බ්‍රහස්පතින්ද | 70.12.17 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70.12.31 බ්‍රහස්පතින්ද | 70.12.24 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

1970 ජූනි 2 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.